CRI
中国国际广播电台
CHINA RADIO INTERNATIONAL

# සුභාසර

# 蓮花

沈鸣

දෙවන කාණ්ඩය - තෙවන කලාපය




## චීන ජනාධිපතිවරයාගේ ඇමෙරිකා නිල සංචාරය

පිටුව 02

## ජොක්හං විහාරස්ථානය

පිටුව 16

## හරිත සංකල්පයෙන් විශේෂ සරු අස්වැන්න ලැබීම

පිටුව 14

## චීනයේදී විදුලි මෝටර් රථයට හොඳ කළදසාවක්

පිටුව 29

## මී පැණි රූපලාවණ්‍ය ක්‍රම කිහිපයක්

පිටුව 37


中国国际广播电台和斯里兰卡红十字协会联合出版




# චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය

චීනය සහ ජාත්‍යන්තර ප්‍රජාව එකට එක් කරමින් චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය ආරම්භ කෙරුණේ 1941 දෙසැම්බර් මස 3 වැනි දාය. අද වන විට එය ලොව පුරා වැඩිම භාෂා ගණනාවක් විකාශනය කරන විශාලතම ගුවන් විදුලි ජාලයක් බවට පත්ව තිබේ. එයින් ලොව පුරා විකාශනය කෙරෙන භාෂා ගණන මේ වන විට 65කි. ලෝකයේ සංනිවේදන විධික්‍රම වඩාත් පුළුල් වීමත් සමඟ අන්තර්ජාල රූප මාධ්‍ය හා ජංගම දුරකථන සහ පොඩ්කාස්ටින් වැනි නූතන බහුවිධ මාධ්‍ය ඔස්සේ සිය විකාශන ජාලය ශක්තිමත් කිරීමට චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය පියවර ගත්තේය.

ඒ අනුව වසර 2011 ජනවාරි 18 වනදා CIBN චීන අන්තර්ජාතික ගුවන්විදුලි විකාශන ජාලය ආරම්භ කෙරිණ. ලොවපුරා ප්‍රවෘත්ති ඒජන්සි මධ්‍යස්ථාන 8ක් පවතින අතර රටවල් 32ක ප්‍රවෘත්ති වාර්තාකරණ ඒජන්සි ආයතන පිහිටුවා තිබේ. ලොව පුරා විසිරුණු කොන්ෆියුසියස් මධ්‍යස්ථාන සංඛ්‍යාව 13කි. චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ අසන්නන්ගේ සමාජ 4114ක් ලොව පුරා ක්‍රියාත්මකය.

蓮花


**චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය**

**SINHALA SERVICE**

**CHINA RADIO INTERNATIONAL**

No.16A, Shijingshan Road,
Beijing, P.R. China
Post code:100040

00 86 10 6889 2330/2374

00 86 10 68892361

sinhalacri@gmail.com

http://sinhalese.cri.cn/

Cheena Sinhala handa

Voice of China-Lanka



**අනුශාසකත්වය**

ජගත් අබේසිංහ

සුදත් මඩුගල්ල

**සංස්කාරක**

ෂාඕ ජී යං

**කතෘ මඩුල්ල**

ශී යුයැ, ෂෙං ලී, ලියු හුයි, ෂාඕ ජී යං, වාං යෝ යෝ, හාඕ ලී ෆාං, වං යිං, හැන් ජීයැන්, සුන් ජීයා ජීයා, බූ යුන්, වෙන් ගුවැන් වන්; චන්දන තිලකරත්න, ඩිල්ෂාන් කීර්තිසර, රවිමල් හඳුවල, අනෝජා දිසානායක

**ප්‍රකාශනය**

චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය සහ

ශ්‍රී ලංකා රතු කුරුස සමාජය


# පටුන


චීන ජනාධිපතිවරයාගේ
ඇමෙරිකා නිල සංචාරය 2

චීන ජනතාව ජපාන ආක්‍රමණයට
එරෙහි යුද්ධය හෙවත් ෆැසිස්ට් විරෝධි
යුද්ධය ජය ගැනීමේ 70 වැනි සංවත්සරය 6

යුද්ධයේ අමිහිරි මතකය සමඟ චීනය
සාමකාමී සංවර්ධනයෙහි අඛණ්ඩව ඉදිරියට 9

වේගයට පමණක් සීමානොවූ
අධිවේගී දුම්රිය 11

හරිත සංකල්පයෙන්
විශේෂ සරු අස්වැන්න ලැබීම 14

ජොක්හං විහාරස්ථානය 16

ටිබෙටයේ බටර් තේ 19

චීන ජන කතාව - ජයග්‍රහණයේ පරාජය 22

චීන කවිය - මහ සුළඟේ ගීතය 23

චෝංයං උත්සවය 24

චීනයේ කැපී පෙනෙන සංගීතඥයා
ජේ චොව් 27

චීනයේදී විදුලි මෝටර් රථයට
හොඳ කළදසාවක් 29

වජ්‍යාං විශ්ව විද්‍යාලය 31

එදිනෙදා චීන බස 34

චීන සූප ශාස්ත්‍රය
කෝලා සහිත කුකුල් පියාපත් 36
තක්කාලි සහිත වම්බටු 36

මී පැණි රූපලාවණ්‍ය ක්‍රම කිහිපයක් 37

ශ්‍රී ලංකා රතු කුරුස සමාජයෙන්
පස්වන පාඩම
ස්වසනය හෝ හෘදය ඇණහිටි
රෝගියෙකුට ප්‍රථමාධාර කරමු 38






# චීන ජනාධිපතිවරයාගේ ඇමෙරිකා නිල සංචාරය

සරත් සෘතුවට අයත් සැප්තැම්බර් මාසය චීන ජාතිකයන්ට නම් වසරේ සුන්දරතම කාලයයි. රන්වන් ගහ කොළවලින් සැරසෙන එම කාලය සරු අස්වැන්නකට හිමිකම් කීම ඊට හේතු වී තිබේ. කෙසේ වෙතත් පසු ගිය සැප්තැම්බර් මාසයේ චීනයට රාජ්‍ය තාන්ත්‍රික සරු අස්වැන්නක් ද ලැබීය. එම කාලය එලෙස අස් වනු සරු වූ ස්වර්ණමය කාලයක් ලෙස සටහන් වී ඇත්තේ චීන ජනාධිපති ශී ජින් පිං මහතාගේ ඇමෙරිකානු සංචාරය නිසාවෙනි.

පසුගිය සැප්තැම්බර් 22 වැනි දා සිට 28 වැනි දා දක්වා චීන ජනාධිපති ශී ජින් පිං මහතා ඇමෙරිකාවේ නිල සංචාරයක නිරත වූ අතර එක්සත් ජාතීන්ගේ සංවිධානය ස්ථාපිත කිරීමේ 70වැනි සංවත්සරය සඳහා පැවති නායක හමුව හා සැමරුම් උත්සව මාලාවට ද සහභාගි විය. චීන ජනාධිපතිවරයාගේ ඇමෙරිකානු සංචාරය විශේෂ පසුබිමක් යටතේයි සිදු කෙරුණේ. චීන ජනතාව ජපාන ආක්‍රමණයට එරෙහි යුද්ධ ජය ගැනීමේ 70වැනි සංවත්සරය හා ලෝකයේ ෆැසිස්ට් විරෝධි යුද ජයග්‍රහණ පිළිබඳ 70වැනි සංවත්සරය මේ වසරට යෙදී තිබිණ. ගෙවී ගිය වසර 70 තුළ ජාත්‍යන්තර තත්වයන් කොපමණ වෙනස් වුව ද සාමය සහ සංවර්ධනය හැම විටම ජගත්









ප්‍රජාවේ පොදු අභිලාෂය වී තිබේ. මානව සමාජය තුළ ස්ථාවර සාමයක් තහවුරු කරන්නේ කෙසේ ද, පොදු සංවර්ධනයක් උදෙසා විවිධ රටවල් සම්බන්ධතා පවත්වන්නේ කෙසේ ද යනාදි ප්‍රශ්න ලෝකවාසීන් ඉදිරියේ දක්නට ලැබිණ.

බටහිර ඇමෙරිකාවේ සියටෙල් නුවරින් ආරම්භ වූ චීන ජනාධිපතිවරයාගේ ඇමෙරිකානු සංචාරය, එරට පාලන මධ්‍යස්ථානය වන වොෂින්ටන් නුවර සහ එක්සත් ජාතීන්ගේ මූලස්ථානය පිහිටි බහුපාර්ශවික ජාත්‍යන්තර වේදිකාව වන නිව්යෝර්ක් නගරය ආවරණය කළේ ය. එම සතියක කාර්යබහුල සංචාරයේදී ශී ජින් පිං ජනාධිපතිවරයා සාමය හා සංවර්ධනය මූලික කර ගෙන චීනය සාමකාමී සංවර්ධනයේ නියැළී සිටීමේ අධිෂ්ඨානය සහ චීන-ඇමෙරිකානු සම්බන්ධතාව නව යුගයට සරිලන ආකාරයට ගොඩ නැගීමේ අභිලාෂය ලෝකයට පෙන්නුම් කළේ ය.

චීන ජනාධිපතිවරයා ඇතුළු දූත පිරිස ඇමෙරිකාවේ සියටෙල් නගරයට සැපත් වූයේ පසු ගිය සැප්තැම්බර් 22වැනි දා. උපාය මාර් ගිය අරමුණුවලට නිවැරදි ව ප්‍රවේශ වෙමින් නැවුම් ආකාරයක දැවැන්ත ආර්ථික දෙකක සබඳතාව චීනය හා ඇමෙරිකාව අතර ගොඩ නැගිය යුතු බව ශී ජින් පිං ජනාධිපතිවරයා එහි පැවති රාත්‍රී රාජ්‍ය භෝජන සංග්‍රහයේදී කීවේ ය. ඔහු සියටෙල්හිදී දෙරටේ ව්‍යාපාරිකයන්, පාසැල් සිසුන් ඇතුළු පිරිස් හමු වූ අතර බෝයිං ගුවන් යානා කම්හල සහ මයික්‍රොසොෆ්ට් සමාගමේ ප්‍රධාන කාර්යාලය නැරඹීය.

ශී ජින් පිං ජනාධිපතිවරයාගේ ඇමෙරිකානු සංචාරයේ සුවිශේෂ අවස්ථාවක් වූයේ වොෂින්ටන් සංචාරයයි.එහිදී ආචාර වෙඩි මුර 21ක් සහිත ව උණුසුම් පිළිගැනීමකට ලක් වූ ඔහු ඇමෙරිකා ජනාධිපති බැරැක් ඔබාමා, ඇමෙරිකා උප ජනාධිපති ජෝ බයිඩන් සහ රාජ්‍ය ලේකම් ජෝන් කෙරී ඇතුළු ඇමෙරිකා රාජ්‍ය නායකයන් හමු විය. එම හමු වීම් අතර චීන හා ඇමෙරිකා ජනාධිපතිවරු දෙපලගේ සාකච්ඡා වඩාත් කැපී පෙනුණි. ගෝලීය උපාය මාර්ගික වැදගත්කමින් යුත් චීන-ඇමෙරිකානු සම්බන්ධතාව ලෝක සාමය හා සංවර්ධනයට විශාල වශයෙන් බල පාන නිසා එම සම්බන්ධතාව වඩාත් යහපත් අන්දමින් වර්ධනය කර ගැනීම දෙරටේ ම පොදු වගකීමක් බවත් නව යුගයට ගැලපෙන ආකාරයට චීන-ඇමෙරිකා සම්බන්ධතාව ගොඩ නැගීම දෙරටේ ම දිගුකාලීන අරමුණක් බවත් එම

හමුවේදී දෙපාර්ශවය පිළි ගත්තේ ය. අන්‍යෝන්‍ය ජයග්‍රහණ ලැබෙන සහයෝගතාවක් හැරෙන්නට චීනයට සහ ඇමෙරිකාවට විකල්පයක් නැති බැවින් රටවල් දෙක අතර ඇතැම් මතභේද හා ගැටුම් තිබුණත් එය අවබෝධාත්මක හා ධනාත්මක ආකල්පයකින් යුතු ව විසඳා ගත හැකි බවට චීන ජනාධිපතිවරයා සිය විශ්වාස පළ කළේ ය. එහිදී ඔහු දෙරටේ සබඳතා වර්ධනයට ඉවහල් වන සය වැදෑරුම් යෝජනාවලියක් ද ඉදිරිපත් කළේ ය. ඇමෙරිකා ජනාධිපති බැරැක් ඔබාමා මහතා චීන ජනාධිපතිවරයාගේ අදහස්වලට එකගතාව පළ කරමින්, චීනයේ සාමකාමී නැගී සිටීම පිළි ගන්නා ඇමෙරිකාව හැම විට ම ඇමෙරිකා-චීන සම්බන්ධතා වර්ධනයට සක්‍රිය ව කටයුතු කරන බව අවධාරණය කළේ ය.

චීන ජනාධිපතිවරයාගේ ඇමෙරිකා සංචාරය චීන-ඇමෙරිකා සම්බන්ධතාවේ ඉදිරි වර්ධනයට පැහැදිලි මග පෙන්වීමක් ලබා දී ඇති අතර එම සබඳතාවට නව ජවයක් ද සපයා තිබේ. ඉදිරියේදී ක්‍රියාත්මක ද්වීපාර්ශවික සහයෝගතා ව්‍යාපෘති 49 එහි ප්‍රබල ප්‍රතිඵලයකි. බලශක්ති, පරිසර සංරක්ෂණ, විද්‍යා තාක්ෂණ, අජටාකාශ ගවේෂණ,යටිතල පහසුකම් සංවර්ධනය, අධ්‍යාපනය, කෘෂිකර්මය හා සෞඛ්‍යයනාදි ක්ෂේත්‍ර එම ව්‍යාපෘති 49 ආවරණය කරයි. 2016 වසර චීන-ඇමෙරිකා සංචාරක වසර ලෙස නම් කිරීමට දෙපාර්ශවය එකග වී තිබේ. එමෙන් ම ජාත්‍යන්තර හා කලාපීය කටයුතුවලදී අත්වැල් බැඳ ගෙන කටයුතු කිරීමට දෙපාර්ශවය කැමැත්ත පළ කර ඇත. ඉරාන හා කොරියානු අර්ධද්වීපයේ න්‍යෂ්ටික ප්‍රශ්න, ත්‍රස්ත මර්දනය,දේශගුණ විපර්යාස, සාම සාධන කාර්යය, තිරසර සංවර්ධනය, ආහාර සුරක්ෂිතතාව හා සයිබර් ආරක්ෂාව වැනි ගෝලීය කරුණු සම්බන්ධයෙන් වඩාත් සමීප ව කටයුතු කිරීමට ද චීනය හා ඇමෙරිකාව තීරණය කර තිබේ.

ශී ජින් පිං ජනාධිපතිවරයා ඇමෙරිකාවේ නැවතී සිටි කාලයේ චීන-ඇමෙරිකා මිත්‍රත්ව කුසුම වඩාත් විකසිත වූ බව පොදු පිළි ගැනීමකි. චීන ජනාධිපතිවරයා සහ එම ආර්යාව බොහෝ අවස්ථාවලදී විවිධ තරාතිරම්වල ඇමෙරිකා ජනතාව හා සෘජු ව අදහස් හුවමාරු කර ගත් අයුරු කාගේත් සිත්වලට තදින් කාවැදුණි. චීන හා ඇමෙරිකා ජනාධිපති ආර්යාවන් දෙදෙනා ම ඇමෙරිකා ජාතික සත්වෝද්‍යානයේදී අලුතින් ඉපදුණු පැන්ඩා පැටවාට නම් තැබීම, චීන-ඇමෙරිකා මිත්‍රත්වයේ නවමු සංකේතයක් සේ සැලකේ.







ශී ජින් පිං ජනාධිපතිවරයාගේ නිල සංචාරය අවසන් වූයේ නිව්යෝර්ක් නුවරින් ය. එහිදී ඔහු එක්සත් ජාතීන්ගේ 70වැනි සංවත්සර සමුළුව මෙන් ම කාන්තා කටයුතු, සාම සාධක හා එක්සත් ජාතීන්ගේ තිරසර සමුළු ඇමතීය. එම අවස්ථා කීපයකදී චීන ජනාධිපතිවරයා එක්සත් ජාතීන්ගේ වසර 70ක ගමන් මග සිහිපත් කරමින් යුද ඉතිහාසය කැඩපතක් සේ සලකා ලෝක සාමය ආරක්ෂා කළ යුතු බව අවධාරණය කළේය. අන්‍යෝන්‍ය විශ්වාසය හා අවබෝධය, සමානත්මතාව,සාධාරණත්වය හා සමාදානය පදනම් වන නව අන්දමේ අන්තර් රාජ්‍ය සමබ්ධතා සංකල්පය ඔහු එහිදී ඉදිරිපත් කිරීම විශේෂත්වයකි. එක්සත් ජාතීන්ගේ සාමාජික රටක් වශයෙන් චීනය සිය වගකීම හා යුතුකම මනා ව ඉටු කළ හා ඉටු කර ගෙන යන බව ඔහු නැවත ප්‍රකාශ කළේ ය. චීනය සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය ඒකාබද්ධ ව සාමය හා සංවර්ධන අරමුදල ස්ථාපිත කිරීම එහි නව පියවරකි.

සංවර්ධනය වෙමින් පවතින රටවලට වැඩිදුර සහය ලබා දීමේ අරමුණින්, දකුණ-දකුණ සහයෝගතා සහනාධාර අරමුදල ස්ථාපිත කිරීමට චීනය තීරණය කළ බව ද චීන ජනාධිපතිවරයා ප්‍රකාශ කළේ ය. එමෙන් ම ඉදිරි වසර 5 තුළ සංවර්ධනය වෙමින් පවතින රටවල් වෙනුවෙන් දිළිඳුකම තුරන් කිරීම, කෘෂිකර්ම සංවර්ධනය,ජෛව ආරක්ෂාව, දේශගුණ වෙනස් වීම්වලට මුහුණ දීම, අධ්‍යාපන හා සෞඛ්‍ය සේවා ඉහළ නංවාලීම ඇතුළු ක්ෂේත්‍ර හය සියයක ආධාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ඔහු ප්‍රතිඥා ලබා දුන්නේ ය. මෙය, ජගත් ප්‍රජාවේ ඉහළ පැසසුමට ලක් විය.

චීන ජනාධිපතිවරයාගේ ඇමෙරිකා සංචාරය චීන-ඇමෙරිකා සබඳතාවට පමණක් නොවෙයි, ලෝක සාමය හා සංවර්ධනයටත් සරු ප්‍රතිඵල ගෙන දී තිබේ. ලෝකයේ සාමකාමී හා ධරණීය සංවර්ධන මාවත උදෙසා චීන ජනාධිපතිවරයා ගෝලීය දෘෂ්ටි කෝණයෙන් යුතු ව සිය ඇමෙරිකා සංචාරය හරහා නව පියවරක් තබා ඇතැයි දේපාලන විචාරකයන්ගේ මතය වී ඇත.

ඉදිරිපත් කිරීම : ෂෙං ලී



# චීන ජනතාව ජපාන ආක්‍රමණයට එරෙහි යුද්ධය හෙවත් ෆැසිස්ට් විරෝධි යුද්ධය ජය ගැනීමේ 70 වැනි සංවත්සරය

චීන ජනතාව ජපාන ආක්‍රමණයට එරෙහි යුද්ධය හෙවත් ෆැසිස්ට් විරෝධි යුද්ධය ජය ගැනීමේ 70 වැනි සංවත්සරය පසුගිය සැප්තෙම්බර් මස 3වනදා යෙදිණ. හමුදා පෙළපාලි සැමරුම් උත්සවය බෙයිජිං නුවර පිහිටි ටියැන් අන් මන් චතුරශ්‍රයේදී පැවැත්විණ.

මෙවර පෙළපාලියට දෙස් විදෙස් හමුදා නියෝජිත කණ්ඩායම් 67ක් එක් විය. ඒ අතර චීන හමුදා නියෝජිත කණ්ඩායම් 50කි. පාබල හමුදා කණ්ඩායම් 11ක් එහි ගමන් කළේ ය. ජ්‍යෙෂ්ඨ පුරවැසි හමුදා සාමාජිකයන් ඇතුළු කණ්ඩායම රථ දෙකකින් ගමන් කළේ ය. හමුදා සන්නද්ධ කණ්ඩායම් 27කි. ගුවන් හමුදා නියෝජිත කණ්ඩායම් 10ක් ඊට එක්වී සිටියේ ය. පෙළපාලියට එක් වූ චීන හමුදා භටයන්ගේ සමස්ත සංඛ්‍යාව දොළොස් දහසකි. රුසියාව හා කසක්ස්ථානය යනාදි රටවල් 10කට වැඩි සංඛ්‍යාවකින් හමුදා නියෝජිත කණ්ඩායම් 17ක් මෙවර පෙළපාලියට සහභාගි විය.

හමුදා සන්නද්ධ පෙළපාලියට ගොඩබිම් ප්‍රහාරක, ගුවන් යානා නාශක මිසයිල, නාවික ප්‍රහාර හා ආරක්ෂාව, යුද්ධ ප්‍රහාර, තොරතුරු සහනාධාර සහ අතිරේක සන්නද්ධ ආරක්ෂාව යනාදි යුධමය ආකාර කොටස් 6ක් ඇතුළත් විය. පෙළපාලියේ ප්‍රදර්ශනය කළ නවීකරණ තාක්ෂණය සහිත සන්නද්ධ උපකරණ තුළින් 84%ක් ප්‍රථම වරට ලෝකයට ප්‍රදර්ශනය කිරීමට ද විශේෂත්වයකි.




















# යුද්ධයේ අමිහරි මතකය සමඟ චීනය සාමකාමී සංවර්ධනයෙහි අඛණ්ඩව ඉදිරියට

ඉදිරිපත් කිරීම : ශී යුයැ සහ ලියු හුයි




පසුගිය සැප්තැම්බර් මාසයේ 3 වනදා ෆැනිස්ට් වාදයට එරෙහි යුද්ධයෙන් ලෝ වැසියන් ජය ගැනීමේ 70 වන සංවත්සරය සහ චීන ජනතාව ජපාන ආක්‍රමණික යුද්ධයෙන් ජය ගැනීමේ සංවත්සරය නිමිත්තෙන් විශාල පරිමාණ අනුස්මරණ උළෙලක් බෙයිජිං නගරයේ ගම්භීර ආකාරයෙන් පැවැත්විණ. එම උත්සවය අමතමින් චීන ජනාධිපති ශී ජින් පිං මහතා, චිනය සාමකාමී ප්‍රතිපත්තියේ අඛණ්ඩව නියැළී සිටීමේ අධිෂ්ඨානය යළිත් අවධාරණය කළේය. චින හමුදා බලඇනියෙන් භටයන් ලක්ෂ 3ක පිරිසක් අඩු කරන බව ඔහු එහිදී ප්‍රකාශ කිරීම එම අධිෂ්ඨානය පිළිබිඹු වීමකි. යුද්ධය කැඩපතකි. මේ කැඩපතින් අපිට පෙන්විය යුත්තේ සාමයේ වටිනාකම බව ද ශී ජින් පිං මහතා එහිදී කියා සිටියේය.

යුද්ධයෙන් අතීත චීන මුතුන් මිත්තන් අත්වැඳි පීඩාව යළිත් ලොව කිසිවකුටත් උරුමවීමට ඉඩ නොතබන බවට ඔහු ලෝකය හමුවේ අවධාරණය කිරීම තුළින් චීනයේ සාමකාමී සංවර්ධන ගමන් මග මනාව පැහැදිළි වේ.

## පසුබිම

යුධවාදය ලෙසට හඳුන්වන්නේ ප්‍රචණ්ඩ බලය හා යුධ ව්‍යාප්තිය අගය කරමින් යුද්ධය සහ විදේශ ආක්‍රමණ ක්‍රියත්මක කිරීම තම රටේ සංවර්ධන පදනමක් වශයෙන් සැලකීමයි. හමුදා පාලනය යටතේ රටේ දේශපාලනය, ආර්ථිකය, සංස්කෘතිය, අධ්‍යාපනය සහ සමස්ත ජනජීවිතය හමුදා හා ආක්‍රමණික සංකල්පය මූළික කරමින් ක්‍රියත්මක වෙයි. පැසිස්ට්වාදය ලෙසට හඳුන්වන්නේ බලාධිකාරීවාදය, අන්ත ජාතිවාදය, උග්‍රජාතිභේදවාදය ආදි එකට එකතු කරන ඒකාධිපතිවාදයයි. එය යුධවාදය වඩාත් අන්තගාමී අයුරින් පිළිබිඹු වීමකි.

වසර 1868 ටේ සිට 1945 වසරේ දෙවැනි ලෝක යුද්ධය අවසන් වන විට, ජපානය චීනය හා උතුරු කොරියාව ඇතුළු රටවල් වලට එරෙහිව ආක්‍රමනික යුද්ධ සිය ගණනාවක් ක්‍රියත්මක කර ඇත. ඍහමනහම දූපත අල්ලා ගැනීම, තායිවානය අත්පත් කර ගැනීම, උතුරු කොරියාවේදී යටත් විජිත පිහිටුවීම, චීනය ආක්‍රමණය කිරීම ඇතුළු සියලූ අපරාධ ක්‍රියාකරකම් හේතුවෙන් ඒ කලාප වල අහිංසක ජනතාව මිලියන 25කට වැඩි පිරිසක් ජීවිතක්ෂයට පත් වී ඇත. මිලියන 40කට වැඩි හමුදා භටයන් හා සාමාන්‍ය වැසියෝ තුවාල ලැබුහ. ජපානය විසින් කෝටි දෙකකට වැඩි ශ්‍රමිකයන් යුද්ධය වෙනුවෙන් බඳුවා ගන්නා ලදි. ලක්ෂ 4කට වැඩි කාන්තාවන් ලිංගික වහල් සේවයට ගැනීම ද එවක සිදු වූ ප්‍රබල ඛෙදවාචකයකි. එය වර්තමානයේ සිහිපත් කිරීමට ද ඇතැමුන් අකමැති වුවද ඉතිහාසගත සත්‍යය එයයි.

යුධවාදය හා පැසිස්ට්වාදය චීන ජනතාව හා ආසියා ජනතාවට එරෙහිව ක්‍රියත්මක කළ ආක්‍රමණික යුද්ධය දීර්ඝකාලයක් පැවැති අතර වැඩි ම හමුදා බලයක් ඊට යොමු කළේ ය. යුධ කාලයේ සිතා ගත නොහැකි තරම් අපරාධ ක්‍රියාකර්කම් සිදු විය. මහා පරිමාණ ඝාතන රැසක් සිදු වූ අතර චීනයේ නැන් ජීන් නගරයේ පමණක් ජපාන හමුදාව විසින් ලක්ෂ දෙකකට හෝ ලක්ෂ තුනකට වැඩි පිරිසක් කුරිරු ලෙස ඝාතනය කරන ලදි. බැක්ටීරියා ප්‍රහාරය, රසායනික ප්‍රහාරය ඇතුළු පැහැදිලි ලෙස තහනම් සටන් ක්‍රම ජපාන හමුදාව චීන ආක්‍රමණික යුද්ධයේදී භාවිත කර ඇත. ඉහත සඳහන් කළ සියලූ හේතු නිසා ජපාන යුධවාදය මානව ශිෂ්ඨචාරයේ

අප්‍රසන්න ම පරිච්ඡේදයක් ලෙසට සටහන් වෙයි.

චීනයේ තායිවාන පළාත වසර 1895හේ ජපානයේ යටත් විජිත පාලනයට ගොදුරු විය. ඊසානදිග චීන ප්‍රදේශ ජපානය විසින් අත්පත් කරනු ලැබුවේ වසර 1931දීය. වසර 1945 වන විට තායිවාන ප්‍රදේශය සහ ඊසාන චීනය යන ප්‍රදේශ දෙකේ දේශපාලනය, ආර්ථිකය, සංස්කෘතිය ජපානයේ සෘජු පාලනය යටතේ පැවතිණ. එනම් ජපානය චීනයේ තායිවාන ප්‍රදේශය වසර 50ක් මෙන්ම ඊසානදිග චීනය වසර 14ක් පුරා අත්පත් කර ගෙන තිබිණ.

ජපාන හමුදාව සෝවියට් දේශයට එරෙහි ප්‍රහාර ක්‍රියාත්මක කිරීමට සූදානම් කර ගැනීම සඳහා බොහෝ යුද ව්‍යාපෘති ආරම්භ කළේ ය. ඒ සඳහා චීන කම්කරුවන් යොදා ගැනිණ. සේවය ලබා ගැනීමෙන් පසු යුද රහස් හෙළිදරව් වීම වැළැක්වීමට එම චීන කම්කරුවන් රහසිගතව ඝාතනය කරනු ලැබිණ. එබඳු ව්‍යාපෘති 7ක් සඳහා සේවය ලබා ගත් චීන කම්කරුවන් තිස් දහසක් ඝාතනය කරනු ලැබූ බව සඳහන් වෙයි.

ඊට අමතරව, එම ආක්‍රමණික යුද්ධයෙන් ජපාන ජනතාවට ද දැඩි හානියක් සිදු විය. ජපාන ජනතාව මිලියන ගණනාවක් යුධ භූමියට යොමු කරමින් මරණයේ ගොදුරු බවට පත් කර ඇත. න්‍යෂ්ටික බෝම්බ ප්‍රහාරයට ලක් වූ ලෝකයේ එක ම රට බවට ජපානය පත් වුයේ ද ඔවුන්ගේ ම මෙම වැරදි නිසාවෙනි.

එහෙත් මෙම නිරර්ථක යුද්ධයෙන් චීනය එදා කොතරම් දුක් ගැහැට වින්ද ද ලෝක ඉතිහාසයෙන් පාඩම් ඉගෙන ගෙන අද චීනය සාමකාමී සංවර්ධන මාවතේ අඛණ්ඩව රැඳී සිටියි.















# වේගයට

## පමණක් සීමානොවූ අධිවේගී දුම්රිය

මීටර් සියය ධාවන ඉසව්ව බිහි වීමෙන් පසු ක්‍රීඩා ලෝලීහු එම ඉසව්වට ඉහළ උනන්දුවක් දක්වති. මෙම උනන්දුවට ප්‍රධානතම හේතුව වන්නේ මීටර් සියය ධාවන තරඟයේදී පුද්ගලයෙකුගේ උපරිම වේගයට පැමිණීමට හැකිවීමයි. එය සුන්දර අත්දැකීමකි. වර්තමානයේ පැයට වේගය කිලෝ මීටර් 300ක අධිවේගී දුම්රිය චීනයේ ගමන් කරමින් සිටී. මෙම අධිවේගී දුම්රිය අපට වේගය පමණක් නොව සුන්දර ප්‍රවාහන අත්දැකීම ද ලබා දෙයි.



අධිවේගී දුම්රියෙන් ගමන් කළමාර්ක් ස්මිත් නමැති බ්‍රිතාන්‍ය ජාතිකයෙකු බෙයි ජිං නගරයේ සිට ශං හැයි නගරය දක්වා අධිවේගී දුම්රිය මගින් ගමන් කර එම අත්දැකීම පිළිබඳ වීඩියෝවක් අන්තර්ජාලයට ඇතුලත් කළේය. එය අන්තර්ජාලයේ ඉතා ජනප්‍රිය විය. වීඩියෝවේ දැක්වෙන්නේ අධිවේගී දුම්රිය ගමන් කරන ක්‍රියා පරිපාටිය හා දුම්රිය තුළ ඇති පහසුකම් ය. ඊට අමතරව වීඩියෝව අවසානයේ මාර්ක් ස්මිත් චීන අධිවේගී දුම්රිය පිළිබඳ දැඩි ප්‍රශංසාව පළ කරන ආකාරය ද දක්නට ලැබේ. වසර කීපයක් තුළ චීන වෙළඳ පොළ ක්‍රමයෙන් විවෘත වීම හේතුවෙන් චීනයේ රැකියා කරන හෝ වෙනත් කරුණු වෙනුවෙන් ජීවත් වන විදේශකයන්ගේ ප්‍රමාණය ද වැඩි වී ඇත. මේවනවිට චීනයේ වේගයෙන් දියුණු වන අධිවේග දුම්රිය පිළිබඳ ඔවුන්ට ඇත්තේ ආධුනික හැඟීමක් නොවේ. ෂෙන් චෙන් නගරයේ වයින් ව්‍යාපාරයක නිරත වන සමන්ත ප්‍රනාන්දු මහතා චීනයේ වසර 20ක කාලයක් සම්පූර්ණ කර තිබේ. ඔහුගේ බිරිඳ චීන ජාතික කාන්තාවකි. තම ව්‍යාපාර වෙනුවෙන් ඔහු විවිධ නගරවල සංචාරයේ නිරත වෙයි. මේ අත්දැකීම මගින් අධිවේගී දුම්රිය පිළිබඳ ඔහුට ගැඹුරු හැඟීමක් ඇත.

මට අධිවේගී දුම්රිය පිළිබඳ කියන්න ගොඩක් දේවල් තියෙනවා. මම මුලින් ම චීනයට ආවේ 1988 වසරේදී. මට ඒ කාලයේ බෙයි ජිං සිට ෂෙන් චෙන් වලට එන්න පැය තිස් නවයක්, හතලිහක් ගත වුණා. දැන් අධිවේගී දුම්රියෙන් බෙයි ජිං වලට ගමන් කරනවා නම් පැය 7ක කාලයකින් බෙයි ජිං වලට ළඟා වෙන්න පුළුවන්. ඉතින් අධිවේගී දුම්රිය ඉතා ම පහසු සේවාවක් සපයනවා. දුරකථන, ලැප්ටොප්, පරිගණ යන්ත්‍ර යනාදී උපකරණවල විදුලි බලය මදි නම් ඕනෑ ම වෙලාවක ආරෝපණය කරලා අඛණ්ඩව පාවිච්චි කරන්න පුළුවන්. සෑම පහසුකමක්ම තියෙනවා. ඊට අමතරව හැම





දුම්රිය මැදිරියකම එක් සේවකයෙක් ඉන්නවා. ඒ සේවකයා විටින් විට කෑම බීම ගෙනවිත් අලෙවි කිරීම වඩත් පහසුවක් බව සමන්ත පවසනවා.

අශ්ව ප්‍රවාහන මාධ්‍යයේ සිට මෝටර් රථ වාහන දක්වාත් ඉන් පසු වර්තමානයේදී අධිවේගී දුම්රිය දක්වාත් ප්‍රවාහන මාධ්‍යය සංවර්ධනය වී ඇත. ඉතිහාසය දෙස ආපසු බලන විට අපිට දක්නට ලැබෙන්නේ ඕනෑ ම ප්‍රවාහන මාධ්‍යයක විකාශය මිනිසුන්ට සංකල්පමය වශයෙන් වෙනසක් ගෙන දිය හැකි බවයි. අධිවේගී දුම්රිය හේතුවෙන් ලෝකය කුඩා ගම්මානයක් බවට පත් වෙමින් තිබේ. අධිවේගී දුම්රිය ප්‍රවාහන ආකාරය පමණක් නොව කාලය හා අවකාශය පිළිබඳ සංකල්පය නවීකරණය කරයි. මේ වන විට සංචාරය කිරීමේදී දුර ප්‍රාමාණය පිළිබඳ මිනිසුන්ගේ අවබෝධය වෙනස් වී තිබේ. ඔවුහු වෙලාව මගින් දුර ප්‍රමාණය තේරුම් ගැනීමට ප්‍රියතාවක් දක්වති. ඒ අතරින් අධිවේගී දුම්රිය ප්‍රධාන මිනුමකි. උදාහරණයක් ලෙසට බෙයි ජිං සිට ගුවං චොව් දක්වා අධිවේගී දුම්රිය මාර්ගය ආරම්භ වීමෙන් පසු එම නගර දෙක අතර දුර ප්‍රමාණය කතා කිරීමේදී කිලෝමීටර් 2000ක් යැයි ප්‍රකාශ කිරීමක් සිදු නොවේ. පැය 8ක් යනුවෙන් පැවසීම දක්වා වෙනස වී තිබේ. ඇමෙරිකානු ප්‍රවෘත්ති සඟරාවේ වාර්තාවට අනුව අධිවේගී දුම්රිය හේතුවෙන් මානවයා සිය ජීවත් වන ගොඩබිම පිළිබඳ අදහස් වෙනස් වී තිබේ. චීන ජනතාව ගමන් කරන පරාසය විශාල වී ඇත. අධිවේගී දුම්රිය මාර්ගය චීනයේ පැතිරීම හේතුවෙන් ගමන් කරන ආකාරය, ජීවත් වීමේ සංකල්පය, වැඩ කිරීමේ පරිසරය හා සංචාරය කරන ස්ථානය යනාදී විවිධ අංශවලට විශාල වෙනස්කම් සිදු වෙමින් පවතී.

අනුර සිල්වා මහතා ෂෙන් චෙන් නගරයේ තාක්ෂණික සමාගමක විධායක නිලධාරියෙකි. 1985 වසරේ ඔහු චීනයට පැමිණ තිබේ. ඔහු චීනයේ ජීවත්ව සිටින කාලය වසර 30කි. දිගු කාලීන අත්දැකීමෙන් චීනයේ සංවර්ධනය විශේෂයෙන් ම අධිවේගී දුම්රියෙන් චීනයට ලබා දෙන වෙනස්කම් පිළිබඳ ඔහුට විශේෂ අදහස් පවතී.

අධිවේගී දුම්රියෙන් මුළු චීනය ම වඩාත් සමීප වී ඇති බව අනුර මහතා පවසයි. අධිවේගී දුම්රිය පමණක් නොව චීනයේ බොහෝ නගරවල ඇති උමං දුම්රිය ජාලයෙන් මුළු ධාවන පද්ධතිය ම සම්බන්ධ කිරීමේ හැකියාව පවතී. චීනයට මෙය ඉතා මත් හොඳ ක්‍රමයක්. එය ජීවිතය පහසු කරවන බව ඔහු පවසයි.

අධිවේගී දුම්රිය වේගයෙන් ව්‍යප්ත වීම හේතුවෙන් චීන ප්‍රවාහන සංවර්ධනය හා ව්‍යුහාත්මක වෙනසට එය උපකාරී වී ඇත. අධිවේගී දුම්රිය මාර්ගයෙන් විවිධ ප්‍රදේශ සම්බන්ධ කිරීම කඩිනමින් වී ඇත. විවිධ ප්‍රදේශ සම්බන්ධ කිරීමෙන් පසු ඒ ඒ ප්‍රදේශවල ආර්ථික ප්‍රතිඵල දියුණු විය හැකි අතර ආර්ථික සම්පත් නිර්මාණය කළ හැකිය. ඉන් නාගරික සංවර්ධන රටාව හා ප්‍රාදේශීය ආර්ථික රටාව වෙනස් වෙයි. එමගින් සමස්ත සංවර්ධනය විශාල වන අතර ජනතාවගේ තෘප්තිමත්භාවය ද ඉහළ යයි. වෙනස් නගර අතර දුම්රිය ප්‍රවාහන පද්ධතිය මගින් වැඩ කරන නගරය හා ජීවත් වන නගරය එකම ස්ථානයන් වීමට අවශ්‍ය නැත. එය නාගරිකකරණ තදබදය ක්‍රමයෙන් අඩු වීමට හේතු වෙයි. උදාහරණයක් ලෙසට බෙයි ජිං හා ටියැන් පින් නගරය අතර අධිවේගී දුම්රය ගමන් කරන වෙලාව පැයකට අඩුය. බෙයි ජිංහි නිවාස මිල ගණන් ඉහළ යාම හේතුවෙන් බොහෝ අය ටියැන් පින් නගරයේ නිවාස මිලදී ගෙන සිටිති. ඔවුහු අධිවේගී දුම්රියෙන් රැකියා සඳහා බෙයි ජිං වෙත පැමිණෙති. ඔවුන්ට බෙයි ජිං හා ටියැන් පින් නගරය එක් නගරයක් ලෙසට හැඟීමක් පවතී. මේ වැනි ජීවිත ක්‍රමය පුද්ගල ගමන් පරාසය පුළුල් කරන අතර සමාජයීය සම්පත් භාවිත කිරීමේ හැකියාව ද ඉන් දියුණු වෙයි.

ගුවං චොව් නගරයේ උදේ ආහාර ලබා ගෙන වූ හන් නගරයේ දිවා ආහාරය රැගෙන චෙන් චොව් නගරයේදී රාත්‍රී නූඩල්ස් ආහාරයට ගෙන අලුයමේදී බෙයි ජිංහි ජාතික කොඩිය එසවීම බලනවායැයි කියන කියමන් බිහි වී ඇත්තේ අධිවේග දුම්රියේ පහසුව නිසයි. ජනතාවගේ දෛනික ජීවිතය සිට ජාතික සංවර්ධන උපාය මාර්ගය දක්වා අපිට දක්නට ලැබෙන්නේ අධිවේගී දුම්රිය නිර්මාණය කරන පහසුව හා අවස්ථාවන්ය.





ඉදිරිපත් කිරීම : වෙන් ගුවැන් වන්





# හරිත සංකල්පයෙන් විශේෂ සරු අස්වැන්න ලැබීම



ඉදිරිපත් කිරීම : හාඕ ලී ෆාං





2015 වසරේ ග්‍රීෂ්ම කාලයේ අස්වැන්නේ නව විශේෂත්වයක් පෙනුම් කෙරිණ. "හරිත සංකල්පය" හා "හරිත ක්‍රියා" ග්‍රීෂ්ම කාලයේ ධාන්‍ය නිෂ්පාදන ක්‍රියාදාමයේ පූර්ණ තේමාව වීම එම විශේෂත්වයයි.

හරිත සරු අස්වැන්නට ගැඹුරු ආර්ථයක් තිබේ. අසමාන ආකාරයකින් සමාන අස්වැන්නක් ලබා ගත හැකි බව ඉන් පෙන්නුම් කෙරෙ.

ධාන්‍ය නිෂ්පාදනය වසරින් වසර වැඩි කිරීමත් සමඟ සම්පත් සහ පරිසරය යනාදි තත්ත්ව අනුක්‍රමයෙන් සීමාවකට ලක් වී ඇත. ධාන්‍ය නිෂ්පාදනය සහතික කිරීම සඳහා නිර්මාණශීලිත්ව තාක්ෂණ ක්‍රමවේද අවශ්‍ය වෙයි. වැඩි අස්වැන්නක් සඳහා නිෂ්පාදනය සහ පරිසර ආරක්ෂාව සහතික කිරීමේ නව ආකාර මගින් 2015 වසරේ ග්‍රීෂ්ම කාලයේ මෙම සරු අස්වැන්න ලැබී තිබේ.

එම විශේෂ සරු අස්වැන්න ලබා ගැනීමට හේතුවූයේ චීන රජයේ ඉහළ අවධානය සහ ස්ථිර අධිෂ්ඨානයයි. හරිතකරණය සහ නිෂ්පාදන ක්‍රමවේද පරිවර්තනය, වත්මන් කාලයේ චීන මධ්‍යම කාරක සභාව ඉදිරිපත් කරන කෘෂිකර්මික සංවර්ධනයේ නව ප්‍රතිපත්ති ය. වසර 2014රේ නොවැම්බර් මාසයේ චීන ජනාධිපති ශී ජින් පිං මහතා ෆූ චිඇන් පලාතේ නිරීක්ෂණ චාරිකාවක නිරත විය. ඔහු එම නිරීක්ෂණය තුළ කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ නව යෝජනා පහක් ඉදිරිපත් කළේය. කෘෂිකාර්මික සංවර්ධන ක්‍රමවේද පරිවර්තනය කඩිනම් කිරීම, ඉඩම්වල ධාන්‍ය නිෂ්පාදන, සම්පත් ප්‍රයෝජන අනුපාතය හා ශ්‍රමික නිෂ්පාදන ඵලදායිතාව අඛණ්ඩ ලෙස ඉහළ නැංවීම මෙන්ම කෘෂිකර්මය අඛණ්ඩව වර්ධනය කිරීම ද එයට ඇතුළත් විය. වසර 2015හේ චීන මධ්‍යම කාරක සභාවේ ප්‍රථම ලේඛනයේ පෙන්වා දෙන්නේ සම්පත් පරිසරයේ සීමාව යටතේ කෘෂිකාර්මික නිෂ්පාදිත ඵලදායික සැපයුම් හා ගුණාත්මක ආරක්ෂාව සහතික කළ යුතු බවයි. කෘෂිකාර්මික සංවර්ධන සහ ධාන්‍ය නිෂ්පාදන ක්‍රම පරිවර්තනය කිරීම පිළිබඳ චීනයේ ස්ථිර අධිෂ්ඨානය එම අදාළ ක්‍රියාවලින් පිළිබිඹු වෙයි. චීන මධ්‍යම රජයේ ඉහළ අවධානයෙන් ග්‍රීෂ්ම කාලයේ අස්වැන්න තුළ හරිත සංකල්පය ස්ථිර වෙයි.

එම විශේෂ සරු අස්වැන්න ලබා ගැනීමට තවත් හේතුවක් වනුයේ චීනයේ විවිධ මට්ටමේ කෘෂිකාර්මික ආයතන උපරිම ලෙස ප්‍රවර්ධනය කිරීමයි.





වසර 2014 අග භාගයේ ජාතික කෘෂිකාර්මික කාර්ය සමුළුවේදී ධාන්‍ය නිෂ්පාදනය හා ගොවියන්ගේ ආදායම් සහතික කරමින් නිෂ්පාදන ව්‍යුහය සකස් කිරීම පිළිබඳ කාර්ය සැලැස්මක් නියම කෙරිණ. 2015 වසරේ සිට චීනයේ විවිධ ප්‍රදේශ එම සැලැස්ම වේගවත්ව ක්‍රියාත්මක කරන්න පටන් ගත්තේ ය. රසායනික පොහොර හා කෘමිනාශක භාවිතය අඩු කිරීම, විද්‍යාත්මක ආකාරයකින් පොහොර යොදා ගැනීම සහ කෘමින් හා රෝග පාලනය කිරීම යනාදි කටයුතු චීනයේ විවිධ ප්‍රදේශවල පිළිවෙළින් සිදු කෙරිණ.

එම විශේෂ සරු අස්වැන්න ලබා ගැනීමට තුන්වැනි හේතුව වූයේ කෘෂිකාර්මික නිෂ්පාදන ක්‍රමවේදයන්හි නිර්මාණශීලිත්වයයි. කෘෂිකාර්මික නිෂ්පාදන ක්‍රමවේදයේ නිර්මාණශීලිත්වය වගාව, ඉඩම් පාලනය, අස්වැනු නෙළීම, ධාන්‍ය ප්‍රවාහනය, ධාන්‍ය වියලීම සහ ධාන්‍යාගාරවල ගබඩා කිරීම යනාදි හැම පියවරක්ම ඉන් පිළිබිඹු වෙයි. වගාව අතින් විද්‍යාත්මක තාක්ෂණය යොදා ගෙන පස සරු කොට තිබේ. ගොවිතැන් කරන ක්‍රමවේද දියුණු කොට තිබේ. එමෙන්ම කුඹුරු පාලනය දියුණු කර තිබේ. ජලය, පොහොර හා කෘමිනාශක පාලනය කරමින් පරිසරය ආරක්ෂා කෙරෙයි. අස්වැන්න කැපීම අතින් නවීන තාක්ෂණය යොදා ගෙන අස්වනු කැපීමේ කාර්යාක්ෂමතාව ඉහළ නංවා තිබේ. එසමඟ ම ධාන්‍ය වියළීම වැදගත් පියවරකි. වියළීමෙන් පසු ධාන්‍ය යළි පොලව මත නොදමා සෘජුව ධාන්‍යාගාරවල ගබඩා කිරීම සිදු කෙරිණ. කෘෂිකාර්මික විද්‍යාත්මක නිර්මාණශීලිත්වයෙන් ග්‍රීෂ්ම කාලයේ ධාන්‍ය නිෂ්පාදනයේ හරිත ස්වභාවය වර්ධනය විය.

2015 වසරේ ග්‍රීෂ්ම කාලයේ සරු අස්වැන්නට විවිධ හේතු බලපෑ වෙයි. ධාන්‍ය සංවර්ධන ක්‍රමවේද පරිවර්තනය එහි ප්‍රධානම හේතුවයි. ක්‍රමවේද පරිවර්තනය දීර්ඝ කාලීන හා අසීරු කටයුත්තකි. චීනය කෝටි 130 ක ජනතාවගේ ආහාර ප්‍රශ්නය විසඳා ගත යුතු අතර ජෛව පරිසර හා සම්පත් ආරක්ෂාව සහතික කළ යුතු ය. චීනයේ විවිධ මට්ටමේ කෘෂිකාර්මික ආයතන, විවිධ ධාන්‍ය නිෂ්පාදන ප්‍රධාන ප්‍රදේශ සහ විද්‍යා හා පර්යේෂණ විශේෂඥයන් ඒකාබද්ධව වෑයම් කොට ධාන්‍ය හා කෘෂිකාර්මික අඛණ්ඩ සංවර්ධනය ළඟා කරගනු ඇතැයි අපි විශ්වාස කරමු.





# ජෝක්හං විහාරස්ථානය

ශාක්‍ය මුනීන්ද්‍රයාණන් වහන්සේ තමන් වහන්සේගේ පිළිම තුනක් නිර්මාණය කිරීමට අවසර දුන් බව ටිබෙට් විශ්වාසයයි. ඉන් එක් පිළිමයක් අට හැවිරිදි විය පිළිබිඹු වන සේයි. දෙවැන්න දොළොස් හැවිරිදි විය පිළිබිඹු වන සේයි. තුන්වැන්න වැඩිහිටි විය පිළිබිඹු වන සේයි. දොළොස් හැවිරිදි ශාක්‍යමුනි පිළිමය තැන්පත් ඇත්තේ චීනයේ ටිබෙට් ස්වායත්තයේ ලාසා නුවර ජෝක්හං විහාරස්ථානයේ.

ලාසා නගර මධ්‍යයේ පදිකයනට පමණක් වෙන් වුණු බාපියාඕ චතුරශ්‍රය පිහිටා තිබේ. මෙම චතුරශ්‍රය කෙළවර පැරණි තාලයේ විහාර මන්දරයක් පිහිටා තිබේ. එම මන්දිරයේ රන් පියස්ස මතින් ඉහළට එසැවුණු කොත් කැරළි හිරු රැසින් බබළයි. මුව පොව්වන් දෙදෙනෙකු මැදි කර ගත් ධර්ම චක්‍රය කොත් කැරළි අතරින් කැපී පෙනෙයි. එය ජෝක්හං විහාරයේ ලාංඡනයයි.

ජෝක්හං විහාරය ටිබෙට් බසින් අර්ථ දැක්වෙන්නේ බුදු මැදුර යනුවෙනි. මෙම බුදු මැදුරේ ඉතා දුර්ලභ මිළ කළ නොහැකි වටිනා පිළිම සහ වස්තු සම්භාරයක් තැන්පත් කර තිබේ. බුදු මැදුරු විහාරය ඉදි කෙරුණේ ටිබෙටියේ ආගමික, සංස්කෘතික හා අධ්‍යාපනික පුනරුදයේ නියමුවා ලෙස සැලකෙන සොංත්සන් ගම්-පො රජතුමන්ගේ යුගයේදීයි.

එතුමන් නේපාලයේ ත්‍රිත්සුං රාජ කුමාරිකාව ද, චීන අධිරාජ්‍යයාගේ දියණිය වූ වෙන්චෙං කුමරිය ද සරණ පාවා ගත්තේ දෙපසේ පිහිටි රාජ්‍යයන් සමග නෑ සබඳකම් ඇති කර ගැනීම රටේ ආරක්ෂාවට බලවත් රුකුලක් වන බැවිනි.

මේ කුමාරිකාවන් දෙපළ ටිබෙටයට පැමිණියේ අතිමහත් වූ වස්තු සම්භාරයක් පමණක් නොව දැනුම් සම්භාරයක් ද සමගිනි. ත්‍රිත්සුං කුමරිය හිමාලයානු බුදු දහමට අයත් පතපොත, බුදු පිළිම ආදිය රැගෙන ආ අතර වෙන්චෙං කුමරිය චීන බුදු දහමට අදාළ ග්‍රන්ථ ගණනාවක් සහ බුදු පිළිම රැගෙන ආවාය. සංඝයා වහන්සේලා ගණනාවක් ද කුමාරියන් සමග ටිබෙටයට වැඩම කළහ.



ජොක්හං විහාරය ඉදි කෙරුණේ චීන, නේපාල, ඉන්දීය හා ටිබෙට් ගෘහ නිර්මාණ රටා සම්මිශ්‍රණයකිනි. ත්‍රිත්සුං කුමරිය කත්මණ්ඩු නුවර සිට ගෙන ආ ශාක්‍යමුනි ප්‍රතිමාව සහ අනෙකුත් වස්තූන් එහි තැන්පත් කෙරිණි.

විහාරස්ථානයේ ඉහළ මාලයට ගිය විට මුලු මහත් ලාසා නුවර ම අපූරුවට දිස්වෙයි. මෑත පෙනෙන කන්දේ සුවිශාල මාළිගය ඒ අතර කැපී පෙනෙයි. ඒ පෙනෙන්නේ පොටාලා මාළිගයයි. ලාමාවරුන්ගේ ධර්ම කෙන්ද්‍රස්ථානය ලෙස සැලකුණේ මේ මාළිගයයි. ජොක්හං විහාරස්ථානය මෙන් ම පොටාලා මාළිගය ද යුනෙස්කෝ සංවිධානය විසින් ලෝක උරුමයන් සේ නම් කර තිබේ.

1409 දී ටිබෙට් බෞද්ධාගමික නායකයෙකු වූ ත්සොන්ග්කාපා ස්වාමීන් වහන්සේ ජොක්හං විහාරයේ මහා පූජෝත්සවය ආරම්භ කළහ. ටිබෙට් බුදු දහමෙහි විවිධ නිකායන් නියෝජනය කරන සංඝයා වහන්සේලා මේ පූජෝත්සවයට සහභාගි වෙති. 17 වන සියවසේ දී පස්වන දළයි ලාමාතුමෝ මේ පූජෝත්සවයේ දින වකවානු දීර්ඝකොට නවාංග ගණනාවක් ද ඊට එක් කළහ.

ඒ අනුව ටිබෙට් දින දර්ශනයේ පළමු මාසයේ 3 වන දා සිට 27 වන දා දක්වා මේ මහා පූජෝත්සවය පැවැත්විය යුතු වෙයි. ඊට සහභාගි වන විවිධ නිකාය නියෝජනය කරන සංඝයා වහන්සේලා පැරණි ධර්ම ග්‍රන්ථයන් පිළිබඳ ගැඹුරු සාකච්ඡා වට හා වාදවිවාදයට එක් වෙති. ඒවා වනපොත් කරති. සජ්ඣායනා කරති. ධර්ම ඥාණය ඉහළින් ම ඇති ස්වාමීන් වහන්සේලා මෙහිදී ගෙෂේ ලරම්පා යන ගෞරව නාමයෙන් පිදුම් ලබති.

ටිබෙට්යේ තියෙන පැරණි ම පන්සල තමයි ජොක්හං විහාරය. බුදුහාමුදුරුවෝ ජීවමාන කාලයේ උන්වහන්සේගේ ආශිර්වාදය ඇති ව නිර්මාණය කළ දඹරන් පිළිමය තියෙන්නේ ද මේ විහාරයේදීය. එය වැඳ පුදා ගන්න ලැබීම මහා පුණ්‍ය කර්මයක් ලෙස සැලකෙයි.

ඒ පින් සිද්ධ කර ගැනීම සඳහා සෑම දිනක ම වන්දනාකරුවෝ දහස් ගණනක් විහාරස්ථානයට පැමිණෙති. ටිබෙට් ස්වයත්තයේ ලාසා නුවරට පැමිණෙන සංචාරකයින්ගෙන් සියයට අනූවකටත් වැඩි පිරිසක් ජොක්හං විහාර වන්දනාවට එක් වෙති. සංඛ්‍යා ලේඛන පෙන්වා දෙන්නේ වසරකට වන්දනා කරුවන් දස ලක්ෂයකට අධික පිරිසක් විහාරස්ථානය වන්දනාමාන කර ගැනීමට පැමිණෙන බවයි.





ඉදිරිපත් කිරීම : චාං යෝ යෝ







# ටිබෙටයේ බටර් තේ



ඉදිරිපත් කිරීම : ෂාඕ ජී යං



චීනය සහ ශ්‍රී ලංකාව තේ නිසා ප්‍රසිද්ධ රටවල් දෙකකි. චීන මිනිසුන්ගෙන් වැඩි පිරිසක් කොළ තේ බොන්න කැමති නමුත් ලාංකිකයෝ කළු තේ බීමට ප්‍රිය කරති. චීනයේ සුළු ජාතියක් වන ටිබෙට් ජාතිකයන් පානය කරන්නේ මොන තේ ද?

ටිබෙට් ජාතිකයන් සානු ප්‍රදේශයේ වාසය කරන බැවින්, ඔවුන් පානය කරන තේ වර්ගය අප සමඟ සැසැඳීමේදී සම්පූර්ණයෙන් වෙනස් ය. ඔවුහු බටර් තේ පානය කරති.

මෙම තේ සඳහා භාවිත කරන බටර් වර්ගය ඉතා විශේෂ ය. සාමාන්‍ය බටර් සාදන්නේ ගව කිරිවලිනි. එහෙත්, චින්හයි-ටිබෙට් සානුවේ යැක් ගවයන් සිටිති. එබැවින්, මෙම බටර් සාදන්නේ යැක් ගව කිරිවලිනි.

බටර් තේ සාදන්නේ ගඩොල් තේවලිනි. තේ කොළ සම්පීඩනය කරනු ලැබීමෙන් පසු ගඩොල් කැටයක් ආකාරයට ඝණ කුට්ටියක් සෑදේ. එබැවින්, ගඩොල් තේ යන නාමයෙන් හැඳින්වෙයි.

ටිබෙට් ජාතිකයන් බටර් තේ සාදන්නේ මේ ආකාරයෙනි. මුලින්ම, ගඩොල් තේවලින් ස්වල්පයක් රැගෙන භාජනයකට දැමිය යුතු ය. මෙම තේ කොළ කෑලි වශයෙන් සෑදීමෙන් පසු, ජලය ඊට එකතු කළ යුතු ය.

ජලය උණු කිරීමෙන් පසු, ජලයේ තිබෙන තේ කොළ කෑලි ඉවත් කළ යුතු ය. ඉන් පසු, ජලයට යැක් ගව බටර් සහ ලුණු එකතු කර මිශ්‍ර කළ යුතු ය.

ජලය, බටර් සහ ලුණු මනාව මිශ්‍ර වීමෙන් පසු, කිරි බඳු සුදු පැහැති ඉස්ම ඇති වෙයි. ඉන් පසු බටර් තේ පානය කළ හැකි ය.

බටර් සහ ලුණු නැතුව, කෙළින්ම තේ පානය කළ හැකි වුවද ගඩොල් තේ බීමෙන් පසු ආහාර දිරවීමේ වේගය වැඩි වෙයි. ගඩොල් තේ පමණක් පානය කළහොත්, කුසගින්න නොබෝ වේලාවකින් දැනේ. බටර් සහ ලුණුවලින් වැඩි ශක්තියක් ලැබිය හැකි ය. එමගින් සානු ප්‍රදේශයේ සීතළ කාලගුණයෙන් ඇති වන අපහසුතාව වැළැක්විය හැකි ය.

ටිබෙට් ජාතිකයන් වාසය කරන සානු ප්‍රදේශයේ ප්‍රමාණවත් එළවළු වැවෙන්නේ නැත. එබැවින්, ටිබෙට් ජාතිකයන් එළවළු ජාති අනුභව කරන්නේ





අඩුවෙනි. එළවළු හා සැසැඳීමේදී, ගඩොල් තේ එළවළුවලට වඩා ලේසියෙන් ගබඩා කළ හැකි ය. එමෙන්ම, ප්‍රවාහනය කිරීමට ද අසීරු නොවේ. එළවළුවලින් ලැබිය නොහැකි පෝෂණ ද්‍රව්‍ය, බටර් තේවලින් ලැබිය හැකි යැයි දිගුකාලීන ජීවන අත් දැකීමෙන් ටිබෙට් ජාතිකයන් අවබෝධ කර ගෙන තිබේ.

බටර් තේ ටිබෙට් ජාතිකයන්ගේ ජීවිතයේ වැදගත් ස්ථානයක් ගන්නා බව නිසැක ය. බටර් තේ පානය කරන විට, එහි සාම්ප්‍රදායික සිරිත් අනුගමනය කළ යුතු ය.

තේ කොප්පය අතින් රැගෙන මුලින්ම ස්වල්පයක් පානය කළ යුතු ය. 'බටර් තේ හරිම සුවඳයි. ඔබ තේ පානය කරන විට, ගෘහ මූලිකයාට ප්‍රශංසා කළ යුත්තේ හදපු තේවලින් බටර් සහ තේ වතුර වෙන් කරන්න බෑ' යන වාක්‍යවලිනි.

තේ කොප්පයේ තිබෙන බටර් තේ සම්පූර්ණයෙන් ඉවර නොකළ යුතු ය. ස්වල්පයක් ඉතුරු කළ යුතු ය. සාමාන්‍යයෙන් ගෘහ මූලිකයා ඔබගේ තේ කොප්පය පිරෙන තුරු බටර් තේ දෙයි. මෙම අවස්ථාවේදී, ඔබ ප්‍රතික්ෂේප නොකළ යුතු ය.

පිට ප්‍රදේශවලින් ටිබෙට් සානුව වෙත ගියහොත්, බටර් තේ නොබිව්වහොත්, ටිබෙටයට ගියේ නැති බව සැළකේ. සංචාරකයන්ට නම්, තවත් වැදගත් කාර්යභාරයක් තිබේ. බටර් තේ පානය කිරීමෙ-න් සානු ප්‍රදේශයේ ඔක්සිජන් අඩු වීමෙන් ඇති අපහසුතාව අඩු කළ හැකි ය.





























# ජයග්‍රහණයේ පරාජය



ඉදිරිපත් කිරීම : ලියු හුයි

සෙං ගෝ ෆැන් පැරණි චීනයේ චිං රජපෙළපතේ ප්‍රකට නිලධාරියෙක්. ඔහු යුද විශේෂඥයෙක්, ධර්ම ශාස්ත්‍රඥයෙක්, දේශපාලනඥයෙක් සහ සාහිත්‍යධරයෙක් ලෙස හැඳින් වෙනවා. ඒත් මෙතරම් උසස් ජයග්‍රහණය දිනා ගත් මේ පුද්ගලයා කුඩා කාලයේ දක්ෂ දරුවෙක් නෙවෙයි. මේ කතාව ඒ බව පැහැදිලි කරනවා.

එක්තරා රාත්‍රියක කුඩා සෙං ගෝ ෆැන් තනිවම ගෙදර සිට පොතක් කියවමින් හිටියා. ඔහු එකම ලිපිය කීප වරක් උස් හඬින් කියෙව්වා. එය සම්පූර්ණයෙන් කට පාඩම් කරන්න ඔහු උත්සාහ කළා. ඔහු ඒ ආකාරයට පාඩම් කරන කොට හොරෙක් ඔහු සිටි කාමරයේ පියස්සෙහි සැඟ වී සිටියා. හොරා ගැන ඔහු දැන ගෙන හිටියේ නෑ. ඒ හොරා බලාපොරොත්තු වුණා දරුවා පොත කියැවීමෙන් පසු නිදා ගනී කියලා. ඊට පසු හොරකම සිදු කරන්නයි ඔහුගේ සැලසුම වුණේ. ඒත් මහ රෑ වන කං ඒ දරුවා එකම ලිපිය දිගටම කියවා කියවා සිටියා. හොරාට සොරකම් කරන්න අවස්ථාවක් නැහැ. අන්තිමේදී ඒ සොරාට කෙන්ති ගියා. ඔහු පියස්සෙන් බිමට පැනලා සෙං ගෝ ෆැන්ට මෙහෙම කිව්වා:

'කොච්චර මෝඩ ද ඔයා? මෙච්චර මෝඩ ඔබ ඇයි පාඩම් ඉගෙන ගන්න හදන්නෙ?'

එහෙම කියපු සොරා පුදුම විදියට සෙං ගෝ ෆැන් දිගටම කියවපු ඒ ලිපිය නිවැරදිව කට පාඩමේ කිව්වා. සොං ගෝ ෆැන් පාඩම් කරනවා අහ ගෙන ඉඳලාම ඔහුට ඒක පාඩම් වෙලා. එහෙම සම්පූර්ණ පාඩම කියැවූ සොරා ආපසු යන්න ගියා.

සෙං ගො ෆැන් වැඩිහිටියෙකු වීමෙන් පසු චීන ඉතිහාසයට උපරිම බලපෑම් ශක්තියක් හිමි පුද්ගලයෙකු ලෙස විරුදාවලිය ලැබුවා. ඒ හොරාට සෙං ගෝ ෆැන්ට වඩා වේගයෙන් ලිපියක් කට පාඩම් කරන්න පුළුවන්කමක් තිබුණත් මුළු ජීවිතයේදීම ඔහු හොරෙක්. සෙං ගෝ ෆැන්ගේ බුද්ධිය ඒ හොරාට වඩා අඩු නමුත් උද්‍යෝගිමත්භාවය නිසා ඔහු බොහෝ ක්ෂේත්‍රවල ඉහළ ස්ථානයක් හිමි කර ගත්තා. මේ කතාවෙන් චීන පිරුළක් නිර්මාණය වුණා. 'ට්‍යැන් දාඔ චෝ චීන්' යන්න ඒ. ඒ කියන්නේ 'උද්‍යෝගිමත් අයට අවසානයේ ජයග්‍රහණය ලැබේ' යන්න.









# මහ සුළගේ ගීතය

මහ සුළඟක් නැගේ.
වලාකුළු ඈතට පලා ගොසිනි.
මම මගේ උපන් බිමට පැමිණියමි.
දැන් ලෝකය ම මගේ පැත්තේ.
කොහෙන් ද මම පක්ෂපාතී
නිර්භීත මිනිසුන් හොයන්නේ
මගේ හතර මායිම් රකින්නට අද.

ඉදිරිපත් කිරීම : ලියු හුයි සහ චන්දන තිලකරත්න

පැරණි කාලයේ චීනයේ හන් නමැති ශ්‍රේෂ්ඨ රාජ පෙළපතක් පැවතුණා. ඒ යුගයේ ප්‍රථම අධිරජයා ලියු බාං. ලියු බාං චීන ඉතිහාසයේ ප්‍රසිද්ධ අධිරජයෙකු මෙන්ම, හන් ජාතිය සහ හන් ජාතික සංස්කෘතියේ පුරෝගාමී පුද්ගලයා ලෙසත් හැඳින් විය හැකියි. චීනයේ වැඩිම ජනගහණය ගන්නා හන් ජාතිකයන්ගේ වර්ධනය, චීන සංස්කෘතියේ පැවතීම සහ චීනයේ එක්සත්භාවය සඳහා කැපී පෙනෙන දායකත්වයක් ඔහු ලබා දී තියෙනවා.

ක්‍රි.පූ. 196 වර්ෂයේ යිං බූ නමැති ප්‍රාදේශීය පාලකයා හන් පාලනයට එරෙහිව කැරැල්ලක් ආරම්භ කළා. යිං බූ රණශූරයෙකු නිසා ලියු බාං අධිරජයා තමා විසින්ම ඒ කැරැල්ල මර්දන සටනට ඉදිරිපත් වුණා. ඒ සටනින් ලියු බාං ජය ගත්තා. අගනගරයට ආපසු යන අතර මඟදී, ඔහු සිය උපන් ගම වන පේ කෝරළයට ආපසු ගියා. ගමේ වැඩිහිටියන්, මිත්‍රයන්, තරුණ පරපුර කැඳවා ගෙන දින කිහිපයක් පුරා සාදයක් පැවැත්වුවා. සතුටුම අවස්ථාවක ලියු බාං නිදහස් ආකෘතියකින් කවියක් නිර්මාණය කළා. මහ සුළගේ ගීතය. මේ කවියේ රටේ අනාගතය ගැන අපේක්ෂාව මෙන්, ඔහුගේ කණස්සල්ලත් සඳහන් වෙනවා.








# චෝංයං උත්සවය

ඉදිරිපත් කිරීම : ෂාඕ පී යං

චීනයේ 9වැනි චන්ද්‍ර මස 9වනදා, චීනයේ 'චෝංයං' උත්සවයයි. 'ඊ ජිං' (විපර්යාස ශාස්ත්‍රය) ග්‍රන්ථයේ සඳහන් වන පරිදි, අංක හය 'යින්' අංකය වන අතර අංක නවය 'යං' අංකය වෙයි. පැරණි චීනයේ යින්-යං යනු, හාත්පසින්ම පරස්පර විරෝධි ගුණ ඇති දේ යන්නයි. එහෙත්, මෙම දෙක ප්‍රතිවිරෝධි දේ නොවේ. යින්වලින් දැක්වෙන්නේ මන්දගාමී, මෘදු, සිසිල්, තෙත්, ශාන්ත සහ ඕලාරික දේ ය. ඒවා බොහෝ විට ස්ත්‍රී ගුණ, උපත, රාත්‍රිය හා අඳුර වැනි දේ සමඟ ගැලපෙයි. යංවලින් වේගවත්, දැඩි, වියළි, උණුසුම් සහ කේන්ද්‍රගත දේ නිරූපණය වෙයි. එය ගැලපිය හැක්කේ පුරුෂ ගුණ, දහවල හා ආලෝකය සමඟ ය. 9වැනි චන්ද්‍ර මස 9වනදා යන දිනයෙන් ද්වීත්ව නවය හෙවත් ද්වීත්ව 'යං' ලෙස සැලකේ. ඒ නිසා, චීන ආදිතමයන් සැළකුවේ මෙම දිනය සුබ දිනයක් වන බවයි. චීන ජනතාව මෙම උත්සවය සැමරීම ආරම්භ කළේ පුරාණයේ සිට ය.

චෝංයං උත්සවය සැමරීමේ ක්‍රියාකාරකම් ඉතාමත් සරුසාර ය. සොබා සෞන්දර්යය නැරඹීම, ඉහළ නැඟීම, කපුරු මල් නැරඹීම, කෝනෙල් නමැති ඖෂධීය ශාකයක අතු පැළඳීම, 'චෝංයං' කේක් අනුභව කිරීම සහ කපුරු මල් මත්පැන් පානය කිරීම, මෙම උත්සවයේදී සිදු කෙරේ.

වර්තමාන චෝංයං උත්සවයෙන් නව අර්ථයක් පිළිබිඹු වෙයි. වසර 1989දී, සෑම වසරකම 9වැනි චන්ද්‍ර මස 9වනදා, වැඩිහිටියන්ගේ උත්සවය වශයෙන් නියම කෙරිණ. වැඩිහිටියන්ට ගෞරව දැක්වීමේ දිනය හා වැඩිහිටියන්ට සහාය දීමේ දිනය වශයෙන් ද මෙය සැළකේ.

## චෝංයං උත්සවය පිළිබඳ සුරංගනා කතාව

චෝංයං උත්සවය පිළිබඳ පැරණි ජන කතාවක් තිබේ. පැරණි කාලයේ 'හුවන්ජිං' නමැති පුද්ගලයකු සිටියේ ය. ඔහු 'ෆේචාංෆං' නමැති දෙවියකුගෙන් දේවකෘති හදාරමින් සිටියේ ය. එක් දිනයක, 'ෆේචාංෆං' 'හුවන්ජිං'ට කියා දුන්නේ 9වැනි චන්ද්‍ර මස 9වනදා බරපතල විපතක් ඔහුගේ උපන් ගමේ සිදු වීමට නියමිත බවයි. ඔහු වහාම සිය උපන් ගමට ආපසු යා යුතු බවත් සෑම ගම් වැසියකුට රතු පැහැති කුඩා මල්ලක් සාදා දිය යුතු බවත් 'ෆේචාංෆං' යෝජනා කළේ ය. එමෙන්ම, කෝනෙල් නමැති ඖෂධීය ශාකයක අතු කොටසක් දැමූ මෙම කුඩා මල්ල බාහුවක බැඳිය යුතු ය. ඉන් පසුව, මෙම කුඩා මල්ල පැළඳ ගත් සියළු දෙනා කඳු මුදුනකට කඩිනමින් නැඟිය යුත්තේ කපුරු මල් මත්පැන් ස්වල්පයක් පානය කිරීමෙන් පසු යැයි ද 'ෆේචාංෆං' යෝජනා කළේ ය.

මේ පිළිබඳව ඇසූ 'හුවන්ජිං' කඩිනමින් සිය උපන් ගමට ආපසු ගොස් සිය ගුරුවරයාගේ උපදෙස් නිවැරදිව අනුගමනය කළේ ය. ගම් වැසියෝ ගමේ අසල පිහිටි කඳු මුදුනට නැඟ නැවත සැන්දෑවේදී ආපසු ගමට ගියහ. ඔවුන් ආපසු පැමිණ දුටුවේ ගමේ සියළු සතුන් මිය ගොස් ඇති බවයි. 'ෆේචාංෆං' 'හුවන්ජිං'ට පැවසුවේ මෙම සතුන් ගම් වැසියන් වෙනුවෙන් මිය ගිය බවයි. මේ ආකාරයෙන් ගම් වැසියන්ට විපතෙන් මිදීමට හැකි වී තිබේ.

ඉන් පසුව, කඳු නැඟීම, කෝනෙල් පැළඳීම, කපුරු මල් මත්පැන් පානය කිරීම, චෝංයං උත්සවයේ සාම්ප්‍රදායන් බවට පත් ව තිබේ. මෙම චාරිත්‍ර මගින් විපත් ඇතුළු අසුබ දේ වැළැක්විය හැකි යැයි චීන ජාතිකයෝ විශ්වාස කරති.

## චෝංයං උත්සවයේ චාරිත්‍ර

### ඉහළ නැඟීම

ඉහළ නැඟීම, චෝංයං උත්සවයේ වැදගත්ම ක්‍රියාකාරකමකි. ඒ බැවින්, චෝංයං උත්සවය ඉහළ නැඟීමේ උත්සවය වශයෙන් ද හැඳින්වෙයි. උස් කඳු නැඟීම සහ උස් දාගැබ් හෝ කුළුනු නැඟීම ඊට ඇතුළත් ය.

ඉහළ නැඟීමේ චාරිත්‍රය බිහි වූයේ පැරණි චීනයේ දඩයම් ක්‍රියාවලිනි. ඉන් පසුව, මෙය විනෝදාංශයක් බවට අනුක්‍රමයෙන් පත් ව තිබේ. ඉහළ නැඟ සාද හෝ භෝජන සංග්‍රහ පැවැත්වීම ද සිරිතකි.

චෝංයං උත්සවය යෙදෙන්නේ සරත් කාලයේ ය. ඉහළ අහස, අඩු වලාකුළු සහ මඳ සුළඟ පිරිසිදු වායුව යනු, සරත් සෘතුවේ ලක්ෂණයි. ඔස්මන්තස් මල් ද පිපී තිබෙන්නේ සරත් සෘතුවේ ය. ඒ කාලයේදී



ඉහළ නැඟීමෙන් සොබා සෞන්දර්යය මැනවින් වින්දනය කළ හැකි ය.

**කෝනෙල් හෝ කපුරු මල් පැළඳීම**

කෝනෙල් පැළඳීම, චෝංයං උත්සවයේ චාරිත්‍රයකි. ඒ බැවින්, මෙම උත්සවය කෝනෙල් උත්සවය ලෙස හැඳින්වෙයි. කෝනෙල්, චෝංයං උත්සවයේ වැදගත් සංකේතයකි. කපුරු මල් පැළඳීම, මෙම උත්සවයේ තවත් සිරිතකි. කපුරු මල් පැළඳීමෙන් අසුබ දේ මඟ හැරිය හැකි යැයි චීන ජාතිකයෝ විශ්වාස කරති. කපුරු මල් නියෝජනය කෙරෙන්ෙන් දීර්ඝායුෂ බව ද චීන ජාතිකයන්ගේ විශ්වාසයයි.

කෝනෙල් යනු, චීන සාම්ප්‍රදායික ඖෂධවලට යොදා ගත හැකි ඵල වර්ගයකි. මෙම ඖෂධ පානය කිරීමෙන් පිලාව සහ ආමාශය උණුසුම් කළ හැකි ය. එමෙන්ම, එමගින් වේදනා අවම කළ හැකි අතර ශරීරය ප්‍රාණවත් කළ හැකි ය. කෝනෙල් ගස්වල කොළ කොලරාව සඳහා ප්‍රතිකාරයකි. එහි මූලයෙන් කෘමින් නසා දැමිය හැකි ය. කෝනෙල් පැළඳීමෙන් අසුබ දේ වැළැක්විය හැකි යැයි ද චීන ආදිතමයෝ විශ්වාස කළහ.

එහෙත්, සොං සහ යුආන් යුග දෙකෙන් පසු, කෝනෙල් පැළඳීමේ චාරිත්‍රය අභාවයට ගියේ ය. අසුබ දේ වැළැක්වීම ප්‍රධාන වශයෙන් තේමා කර ගත් මෙම උත්සවය, ජන ජීවිතය යහපත් වීමත් සමඟම වෙනස් වී තිබේ. චීන ජාතිකයෝ සැබෑ



ජීවිතයට විශේෂයෙන් අනාගත ජීවිතයට වැඩි අවධානයක් යොමු කරති. අසුබ දේ වැළැක්වීමට සාපේක්ෂව දීර්ඝායුෂ ලැබීමේ අභිලාෂය ඉස්මතු වී තිබේ. ඒ බැවින්, දීර්ඝායුෂ සංකේතවත් වන කපුරු මල්, කෝනෙල්වල ස්ථානය ගෙන තිබේ.

**කපුරු මල් නැරඹීම**

කපුරු මල්, දීර්ඝායුෂ සංකේතවත් වන මල් වර්ගයකි. දැඩි සීතළට යටත් නොවීමේ සංකේතයක් වශයෙන්, කපුරු මල් බොහෝ චීන ප්‍රාඥයන්ගේ පැසසුමට ලක් වී තිබේ. එමෙන්ම, කපුරු මල්වල නිජබිම වන චීනයේ නිරාන්තරවම මහා පරිමාණ කපුරු මල් ප්‍රදර්ශන පැවැත්වෙයි. සාමාන්‍යෙයන් මෙම කපුරු මල් ප්‍රදර්ශනවලින් බහුතරයක් පැවැත්වෙන්නේ චෝංයං උත්සවයේදී ය. ඒ නිසා, චෝංයං උත්සවය, කපුරු මල් උත්සවය ලෙස ද හැඳින්වෙයි. 9වන චන්ද්‍ර මාසයේ පිපෙන කපුරු මල්, '9වන මාසයේ මල්' යනුවෙන් හැඳින්වෙයි. කපුරු මල් නැරඹීම චෝංයං උත්සවයේ චාරිත්‍රවලින් වැදගත් කොටසක් බවට පත් වී තිබේ.





# චීනයේ කැපී පෙනෙන සංගීතඥයා ජේ චොව්

ඉදිරිපත් කිරීම : බූ යුන්

2011 වසරේ ඇමෙරිකාවේ Time සතිපතා සඟරාව ලෝකයේ විශාලතම බලපෑම පවතින පුද්ගලයන් 100ක් තෝරා ගනු ලැබිය. චීනයේ ඉතා ජනප්‍රිය ගායකයෙක් එම පුද්ගලයන් 100 දෙනාගෙන් දෙවැනි ස්ථානයට තේරී පත් විය. ඔහුගේ නම ජේ චොව්.

ජේ චොව් උපත ලබා ඇත්තේ 1979 වසරේ ජනවාරි මාසයේ 18වැනිදා චීනයේ තායිවාන් පළාතේදීය. ඔහු ගායකයෙක් පමණක් නොව, නිෂ්පාදකයෙක් නළුවෙක් සහ චිත්‍රපට අධ්‍යක්වරයෙක් ද වෙයි. 2000 වසරේ ජේ චොව් ඔහුගේ නමින් ප්‍රථම සංගීත ඇල්බමය නිකුත් කළේ ය. 2002 වසරේ ඔහු චීනය සිංගප්පූරුව මැලෙසියාව සහ ඇමෙරිකාව යනාදී විවිධ රටවල සිය ප්‍රථම ලෝක සංගීත සංචාරයට සහභාගී විය. 2003 වසරේ ඔහුගේ ඡායාරූප ඇමෙරිකාවේ Time සතිපතා සගරාවේ මුල් පිටුවේ පළ කෙරිණ. 2010 වසරේ සිට 2015 වසර දක්වා ඔහු Fobes චීනයේ ප්‍රසිද්ධ පුද්ගලයන්ගේ ලැයිස්තුවට ඇතුළත් වීමද කැපී පෙනේ. 2012 වසරේ ඔහු එම ලැයිස්තුවේ ප්‍රථම ස්ථානයට ද පත් විය. ඒ මෙන්ම 2009 වසරේ ඇමෙරිකාවේ CNN ආයතනය විසින් ඔහු ආසියාවේ විශාලතම බලපෑම පවතින පුද්ගලයා බවට නම් කෙරිණ. 2010 වසරේ ඔහුගේ ගීත බාගත කිරීමේ ප්‍රමාණය ලෝකයේ තුන්වැනි ස්ථානය ගෙන තිබිණ. 2011 වසරේ ජේ චොව් චීනයේ අන්තර් ජාලයේ විශිෂ්ට තරුණයන් දසදෙනාගෙන් එක් අයකු ලෙස තෝරා ගනු ලැබීය. 2011 වසරේ ඔහු හොලිවුඩ් චිත්‍රපටයකට රංගනයෙන් දායක විය. 2013 වසරේ ඔහු ආරාධනයකට අනුව චීනයේ බෙයිජිං විශ්ව විද්‍යාලයේ දේශනයක් සිදු කළේ ය. මෙම වසරේ ජේ චොව් ආසියාවේ ජනප්‍රියම කලාකරු සම්මානය හිමි කර ගැනීමද ඔහුගේ ජීවිතයේ තවත් සංදිස්ථානයකි.






ජේ චොව්ගේ පියා පාසලක භෞතික විද්‍යා ගුරුවරයෙකි. ඔහුගේ මව එම පාසලේම චිත්‍ර කලා ගුරුවරිය විය. ජේ චොව් කණිෂ්ඨ මධ්‍ය පාසලේ දෙවැනි ශ්‍රේණියේ සිටියදී ඔහුගේ දෙමව්පියන් දික්කසාද වී ඇත. ඔවුහු දික්කසාදය ගැන ඒ මොහොතේම ජේ චොව්ට නොපැවසූහ. එහෙත් ටික කලකට පසුව ජේ චොව් දෙමව්පියන් දික්කසාද වී ඇති බව දැන ගෙන ඇත. එය ජේ චොව්ට විශාල මානසික පීඩනයක් ඇතිකර තිබේ. ඉන් පසු ඔහුගේ ඉගෙනීම ඇණ හිටිණ. මේ හේතුවෙන් ජේ චොව්ට විශ්ව විද්‍යාලයට ඇතුල් වීමට ද නොහැකි විය. ජීවත් වීම සඳහා ඔහු ආපණ ශාලාවක වැඩ කිරීමට පටන් ගත්තේ ය. 1997 වසරේ සැප්තැම්බර් මාසයේ පියාගේ මෙහෙයවීම යටතේ ඔහු රූපවාහිනී සංගීත තරගයට සහභාගි විය. මෙම තරගයට පසු ඔහු සංගීත සමාගමක් සමග ගිවිසුමකට අත්සන් කළේ ය. වෙනත් ප්‍රකට ගායකයන් වෙනුවෙන් ගීත නිර්මාණය කිරීම ඔහුගේ කාර්යය විය. එහෙත් ඔහුගේ සංගීත ආකාරය ඉතාම විශේෂ නිසා ඔහු රචනා කළ ගීත වෙනත් ගායකයන් ගායනා කිරීම ප්‍රතික්ෂේප කළේ ය. ඒ හේතුවෙන් ජේ චොව් මානසික පීඩාවන්ට මුහුණ දුන්නේ ය. තමාට සංගීත ක්ෂේත්‍රයේ ජයග්‍රහණ ලැබේවිද නැද්ද යන්න ඔහු දැන සිටියේ නැත. නමුත් ජේ චොව් ඉක්මනින් මානසික තත්වය යහපත් කරගනිමින් තමා රචනා කළ ගීත තමා විසින්ම ගායනා කරන්නට තීරණය කළේ ය. ඉන් පසු ඔහුගේ ගීත සීඝ්‍රයෙන් චීනයේ මෙන්ම සමස්ත ආසියාවේ ජනප්‍රිය වීම ආරම්භ විය. ජේ චොව් ගායකයෙක් වශයෙන් විශාල ජයග්‍රහණ ලබා ගත්තේ ය. මෙම වසරේ ජනවාරි මාසයේ 17වැනි දා ජේ චොව් විවාහ දිවියට ඇතුළත් විය. මෙම වසරේ ජූලි මාසයේ 12වැනිදා ඔහුගේ දියණිය බිහි විය. තමාගේ දෙමව්පියන් දික්කසාද වූ පසු ජේ චොව් සහ ඔහුගේ මව තනිව ජීවත් වූහ. ඒ බැවින් ඔහුගේ මව ජේ චොව්ට විශාල බලපෑම් සිදු කළා ය. වයස අවුරුදු තුනේදී මව පියානොවක් ඔහු වෙනුවෙන් මිලදී ගෙන ඇත. ජේ චොව් කියා සිටියේ ඔහුට බලපොරොත්තුවක් ඇති බවයි. මව සමග සමස්ත ලෝකයේම සංචාරය කිරීම ඔහුගේ එම අපේක්ෂාවයි.

ජේ චොව් පුණ්‍ය කටයුතුවලට සක්‍රිය ලෙස සහභාගි වන්නෙකි. 2008 වසරේ මැයි මාසයේ 12වැනිදා චීනයේ Si Chuan පළාතේ ප්‍රබල භූමි කම්පාවක් සිදු විය. ජේ චොව් විපතට පත් වූ ප්‍රදේශයට චීන යුවාන් මිලියන 42ක් ආධාර වශයෙන් ලබා දුන්නේ ය. 2010 වසරේ නොවැම්බර් මාසයේ ජේ චොව් සහ වෙනත් ගායකයන් කිහිප දෙනෙක් එක්ව පුණ්‍යාධාර මුදලක් එක්රැස් කළහ. ඔවුහු චීන යුවාන් මිලියන 10කට අධික මුදලක් එකතු කොට ඒඩ්ස් රෝග යට ලක් වූ දරුවන්ට ආධාර වශයෙන් ලබා දුන්හ. 2014 වසරේ චීන මහජන ආරක්ෂක අමාත්‍යාංශය විසින් චීනයේ මත්ද්‍රව්‍ය මර්දනය කිරීමේ ප්‍රවර්ධන තානාපතිවරයා වශයෙන් ජේ චොව් තෝරා ගත්තේ ය.

ජේ චොව්ගේ ගීතවලින් රසිකයන්ට අනාගතය කෙරෙහි වඩාත් විශ්වාසයක් හා බලාපොරොත්තුවක් ඇති කරගත හැකි බව ඇතැම් ගීත විචාරකයෝ පැවසූහ. ඔහුගේ ගීත හේතුවෙන් චීන සම්ප්‍රදායික සංස්කෘතිය තරුණයන් අතර ජනප්‍රිය විය. එමෙන්ම ඔහුගේ ගීතවල සක්‍රිය බලයක් පවතින බව ඔවුන්ගේ අදහස වී තිබේ.








# චීනයේදී විදුලි මෝටර් රථයට හොඳ කළදසාවක්

ඉදිරිපත් කිරීම : සුන් ජියා ජියා

පසුගිය දා ලොව මුල්පෙළේ මෝටර් රථ නිෂ්පාදකයකු වන ජර්මනියේ ෆොක්ස්වගන් සමාගමට පරිසර දූෂණ චෝදනා එල්ල විය. වායු විමෝචනනීති දැඩිව ක්‍රියාත්මක අමෙරිකාවේ ෆොක්ස්වගන් සමාගම් ඩීසල් මෝටර් රථවලට අනවසර පරිගණක මෘදුකාංගයක් භාවිත කර තිබේ. එම මෘදුකාංග මගින් වාහන විමෝචන ප්‍රමාණය පරීක්ෂා කරන අවස්ථාවේදී ව්‍යාජ දත්ත ලබා දෙන බව ඇමෙරිකා ජනමාධ්‍යවලින් හෙළි කෙරිණ. මීට අමතරව අමෙරිකානු කොන්ග්‍රස් මණ්ඩලය සහ අධිකරණ දෙපාර්තමේන්තුව මේ පිළිබඳව පරීක්ෂණ රැසක් ආරම්භ කර තිබේ. වෙනත් බලශක්තියෙන් ධාවනය වන රථවල සමග සැසඳීමේදී ඩීසල් මෝටර් රථවල පරිසර හානිය අඩු බව මෙම සිද්ධියට පෙර බොහෝ රටවල් හා සමාන්‍ය ජානතාව විශ්වාස කර තිබේ. මෙම සිද්ධියට පසුව මෙම විශ්වාසය කඩ වී ඇත.

විදුලියෙන් ධාවනය වන මෝටර් රථ අද අපට අමුත්තක් නොවේ. ලෝක පරිසර දූෂණය උග්‍ර වීමෙන් ඛණිජ තෙල් හිඟ තත්ත්වය යටතේ පරිසර හානියට හා බලශක්ති අර්බුදයට විසඳුම් ගෙනෙන නව බලශක්තියෙන් ධාවනය වන මෝටර් රථවලට ලෝකයේ බොහෝ රටවල් අවධානය යොමු කර තිබේ.

ගතවූ වසර කිහිපය තුළදී වායු දූෂණය පාලනය සඳහා මෝටර් රථ අලෙවිය අවම කිරීමට චීනය දැඩි ලෙස පියවර යෝදා ගෙන තිබේ. විශේෂයෙන්ම බේයිජිං හා ශන්හැයි යන ප්‍රධාන නගරවල වාහන අංක ඔත්තේ හා ඉරට්ටේ පිළිවෙළ අනුව ඒ ඒ දිනවල ධාවනය කළ යුතුය. දවසක විමෝචන තත්ත්වයන්ට අනුව මෝටර් රථ භාවිතය තහනම් කිරීම වැනි රෙගුලාසි නිකුත් කර තිබේ. එමෙන්ම සාමාන්‍ය පාරිභෝගිකයන් මෝටර් රථ අංක තහඩු ලොතරැයි ක්‍රම මගින් දිනාගෙන මෝටර් රථ මිලදී ගත යුතුය.

පසුගිය සැප්තැම්බර් මාසේ 29 වනදා පැවති චීන රාජ්‍ය මණ්ඩලයේ රැස්වීමකදී නව බලශක්ති මෝටර් රථ නිෂ්පාදනයට අනුබල දීමට චීන රජය තීරණය කළේය. විදුලි මෝටර් රථවල නිෂ්පාදනයට අනුබල දීමේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරමින් විදුලි මෝටර් රථ මිලදී ගැනීමට එරෙහි කෝටාව ඉවත් කරන බව එහිදී අවධාරණය කෙරිණ. එමෙන්ම 2015 වසරේ ඔක්තෝබර් මස සිට 2016 වසරේ දෙසැම්බර් මස දක්වා විමෝචන ප්‍රමාණය ලිටර් 1.6ක අඩු මෝ ටර් රථ බදු 50%කින් අඩු කිරීමට පියවර ගනී.

මෙම නව රෙගුලාසියට අනුව අමෙරිකානු සමාගම නිෂ්පාදන කළ  ටෙස්ලා හා ජර්මනියේ බී. එම්. ඩබ්ලිව්. විදුලි මෝටර් රථ නිල වශයෙන් බෙයිජිං පැවති මෝටර් රථ අංක තහඩු ලොතරැයි ක්‍රමයේ රථ ලැයිස්තුවට ඇතුළත් කරන බව වාර්තා විය.



පසුගිය චීන ජාතික දින නිවාඩු සමයේ විදුලි මෝටර් රථ බොහෝ දුරට ජනප්‍රියව පැවැතිණ. මේ වන විට වර්ග 30කට අධික විදුලි මෝටර් රථ ප්‍රමාණයක් වෙළෙඳ පොළට පැමිණ තිබේ. 2015 වසර මැද වන විට 620,000කට අධික සැහැල්ලු විදුලි මෝටර් රථ සංඛ්‍යාවක් ලොව පුරා අලෙවිවී ඇති බව වාර්තා වේ. ඒ අතරින් ටෙස්ලා එස් මෝටර් රථ 85,000කි. චීන පාරභෝගිකයෝ ටෙස්ලා විදුලි මෝටර් රථ මිළදී ගැනීමට ඉතාම උනන්දුවක් දක්වති. පසුගිය වසරේ අප්‍රේල් මස ටෙස්ලා සමාගම චීනයේ ශාඛාවක් ස්ථාපිත කරමින් ටෙස්ලා මොටර් රථ 2500ක් චීන වෙළඳ පොළේ අලෙවි කර තිබේ. මේ වසරේ මුල් මාස හයක කාලය තුළදී ටෙස්ලා මොටර් රථ 2147ක් අලවි ඇත.ලෝක ටෙස්ලා අළෙවියෙන් 10%ක් චීනයට හිමි වේ. එහෙත් චීනයේ ටෙස්ලා ඇතුළු විදුලි මෝටර් රථ වීකි ණීමේදී තවමත් බොහෝ අසිරුතාවලට මුහුණ දීමට සිදු වේ. ප්‍රධාන ගැටලුව බැටරිය අධිවේග යකින් ආරෝපණය කිරීමයි. ගෘහස්ත විදුලි සැපයුම් පහසුකම මගින් විදුලි මෝටර් රථ බැටරි ආරෝපණය කිරීමට පැය 8 පමණ අවශ්‍ය වේ. දුර සංචාරය සඳහා කෙටි කාලයක් තුළ අධිවේග යකින් බැටරි ආරෝපණය කළ යුතු නිසා විශේෂ බැටරි ආරෝපණය කිරීමේ මධ්‍යස්ථාන ඉදි කළ යුතුය. රට පුරාම මාර්ග ජාලයේ සම්පූර්ණ විදුලි වාහන සඳහා ආරෝපණය පහසුකම් සංවර්ධනය අත්‍යවශ්‍ය වේ. අමෙරිකාවේ මෙවැනි මධ්‍යස්ථාන 20,000ක් පමණ තිබේ. එම මධ්‍යස්ථාන ඉදි කිරීමේ කටයුතු මේ වන විට චීනයේ ආරම්භක අවධිෙය්ය. එම තත්ත්වය යටතේ ටෙස්ලා සමාගම සහ චීන සුපිරි තරු පහේ හෝටල් රැසක් සහයෝගතා පවත්වා එම හෝටල්වල ආරෝපණ පහසුකම් ඇති කළ තිබේ. මේ වසරේදී චීනයේ ටෙස්ලා මෝටර් රථ වැඩි ප්‍රමාණයෙන් විකිණීය කළ හැකි බවට ටෙස්ලා සමාගම අපෙක්ෂා කරයි.





# චජ්‍යාං
## විශ්ව විද්‍යාලය

දකුණුදිග චීනයේ හංචෞ නගරය එහි සුන්දරත්වය නිසා ලොව පුරා ඉහළ කීර්තිනාමයක් ලත් නගරයකි. මීට අමතරව විශිෂ්ට සහ ලස්සණ විශ්ව විද්‍යාල බොහොමයක් සතුවීම ද එහි විශේෂත්වයකි. ච ජ්‍යාං විශ්ව විද්‍යාලය ඒ අතරින් පැරණි ම මෙන් ම ප්‍රකට ම එකකි.

වසර 1897දී ඉදි කෙරුණු ච ජ්‍යාං විශ්ව විද්‍යාලය චීනයේ ඉපැරණි ම විශ්ව විද්‍යාලයකි. මෙම විශ්ව විද්‍යාලය චීනයේත් ලෝකයේත් කීර්තිනාමයක් ලැබු වේ එහි තිබෙන ඉහළ අධ්‍යාපන මට්ටමක් නිසාවෙනි. මෙම වසරේ ලෝකයේ හොඳ ම ඉන්ජිනේරු විශ්ව විද්‍යාල පිළිබඳ ලේඛනයෙහි 4වැනි ස්ථානය අත්පත් කර ගැනීමට ච ජ්‍යාං විශ්ව විද්‍යාලය සමත් විය. එමෙන් ම ආසියාවේ හොඳ ම විශ්ව විද්‍යාල පිළිබඳ ලේඛනයේ ද මෙම විශ්ව විද්‍යාලය ඉහළ ස්ථානයකට පත් වී තිබේ.

ච ජ්‍යාං විශ්ව විද්‍යාලයට ඇතුල්වීම සඳහා වාර්ෂික ව චීනය පුරා විශිෂ්ට ශිෂ්‍ය ශිෂ්‍යාවෝ බොහෝ පිරිසක් දැඩි තරගකාරිත්වයකින් යුතුව ක්‍රියා කරති. රට පුරා විශිෂ්ට ශිෂ්‍යයන් ඒක්රැස්වීම හේතුවෙන් වාර්ෂික ව මෙම විශ්ව විද්‍යාලය සමාජයට විශිෂ්ට උපාධිධාරීන් රැසක් සපයා දෙයි. එසේ බිහි වූ අය අතරින් බොහෝ දෙනෙක් පසුව චීනයේ ඒ ඒ ක්ෂේත්‍රවල ප්‍රවීණයන් බවට පත් වූහ. ඊට අමතරව, චීනයේ උසස් ම පෙළේ විද්‍යාඥයන්







20කට අධික පිරිසක් ද මෙම විශ්ව විද්‍යාලයේ ඉගැනීම් හා පර්යේෂණ කටයුතුවල නිරත වී සිටිති. ඒ නිසා රටේ සංවර්ධනය හා සමෘද්ධිය වෙනුවෙන් ච ජ්‍යාං විශ්ව විද්‍යාලය මනා පිටුබලයක් බව සඳහන් කළ හැකි ය.

ච ජ්‍යාං විශ්ව විද්‍යාලය චීනයේ විශ්ව විද්‍යාල අතරින් විශිෂ්ට ඉන්ජිනේරු අධ්‍යාපනයක් නිසා ප්‍රකට ය. එහි ඇති පීඨ 36ක් අතරින් ශාස්ත්‍රය, වෛද්‍ය විද්‍යාව, තාක්ෂණය වැනි විෂයයන් වඩා ජනප්‍රිය ය. චීනයේ විද්‍යාව හා තාක්ෂණ ක්ෂේත්‍රයේ බොහෝ ප්‍රවීණයෝ එහි තාක්ෂණික පීඨයේ උපාධිධාරීහු වෙති. තාක්ෂණ විෂය පමණක් නොව, ච ජ්‍යාං විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ විෂය ද ප්‍රකටය. එහි විශිෂ්ට උපාධිධාරීහු බොහොමයක් සිටිති.

මේ වන විට, ච ජ්‍යාං විශ්ව විද්‍යාලයේ ගුරුවරුන්ගේ සංඛ්‍යාව තුන්දහස ඉක්මවා ගොස් ඇත. ඒ අතරින් අඩකටත් වඩා වැඩි පිරිසක් ආචාර්ය උපාධි ලබා ගත් අය වෙති. එමෙන් ම, ශිෂ්‍යයන් හතලිස්දහසකට අධික පිරිසක් එහි සිටිති. ඒ අතරින් රටවල් 120කට වැඩි ප්‍රමාණයකින් ශිෂ්‍ය ශිෂ්‍යාවන් හාරදහසකට අධික පිරිසක් සිටීම විශේෂත්වයකි.

චීනයේ සීඝ්‍ර සංවර්ධනය නිසා, මෑත වසරවල උසස් අධ්‍යාපනය හැදෑරීම පිණිස චීනයට පැමිණි විදේශ ශිෂ්‍යයන්ගේ සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩි වෙයි. මේවැනි පසුබිමක් යටතේ, ච ජ්‍යාං විශ්ව විද්‍යාලය වැනි චීනයේ ඉහළ ම පෙළේ විශ්ව විද්‍යාල විදේශ ශිෂ්‍යයන්ගේ වැඩි අවධානයක් ඇද ගනී.

පසුගිය වසර තුළදී, ච ජ්‍යාං විශ්ව විද්‍යාලයේ සාමාන්‍ය උපාධිය සඳහා ඉගෙන ගන්නා විදේශ ශිෂ්‍යයින්ගේ සංඛ්‍යාව 1300ක් පමණ වෙයි. මේ වසරේ ච ජ්‍යාං විශ්ව විද්‍යාලයේ අංශ රැසක් විදේශ ශිෂ්‍යයන් බඳවා ගනී. සාමාන්‍ය උපාධිය සඳහා විදේශ ශිෂ්‍යයෙකුට මෙහි අවුරුදු 4ක් ඉගෙන ගැනීමට අවශ්‍ය ය. ඉදිකිරීම්, වෛද්‍ය විද්‍යාව වැනි විෂයයන් සඳහා අවුරුදු 5ක් අවශ්‍ය ය. ගුරුවරුන් බහුතරය චීන ජාතිකයන් වීම නිසා සාමාන්‍යයෙන් ශිෂ්‍යයන්ට උගන්වනු ලබනුයේ චීන භාෂාවෙනි. ඒ නිසා විදේශ ශිෂ්‍යයන් පැමිණි මුල් කාලයේදී චීන භාෂාව අධ්‍යයනය කළ යුතු ය. එහෙත්, ඉන්ග්‍රීසි භාෂාවෙන් ද ඉගැන්වීම් කටයුතු සිදු වෙයි.

පශ්චාත් උපාධිය සඳහා සාමාන්‍යයෙන් අවුරුදු 2, 3ක් ගත වෙයි. ආචාර් උපාධිය සඳහා අවුරුදු 4ක් අවශ්‍ය ය.

නිල උපාධි අධ්‍යාපනයට අමතරව, කෙටිකාලික පුහුණු සහ හුවමාරු අධ්‍යාපන වැඩසටහන් ද ච ජ්‍යාං විශ්ව විද්‍යාලය සපයයි. ඒවැනි අධ්‍යාපනයක් ලබන විදේශ ශිෂ්‍යයන් සාමාන්‍යයෙන් මෙහි අවුරුදු 1, 2ක් සිටිති. ඔවුන්ට උපාධිය වෙනුවට සහතික පත්‍රයක් හිමි වෙයි. පසුගිය වසරේ, මෙවැනි කෙටිකාලීන අධ්‍යාපනය හදාරන විදේශ ශිෂ්‍යයන්ගේ සංඛ්‍යාව 800ක් පමණ විය. ඔවුන් අතරින් බහුතරය අධ්‍යයනය කළේ චීන භාෂාවයි.

බාහිර පෙනුම පමණක් නොව, පහසුකම් අතිනුත් මෙම විශ්ව විද්‍යාලය ඉතා විශිෂ්ට ය. ච ජ්‍යාං විශ්ව විද්‍යාලයේ පන්ති කාමර වර්ග මීටර් ලක්ෂ 17කට ආසන්න බිම්සරියක් සතු ව තිබේ. එමෙන්ම නේවාසික කාමර දහසකට ආසන්න ප්‍රමාණයක් ද ඇත. තව ද, ක්‍රීඩාංගන කිහිපයක් ද එහි තිබේ. ඒ අතරින් ප්‍රේක්ෂකයන් දසදහසක් පමණ පිරිසකට පහසුකම් සැලකිය හැකි ක්‍රීඩා සංකීර්ණයක් ද තිබේ. පිහිනුම් තටාක කිහිපයක් ද එහි ඇත. ඊට අමතරව, විදේශ ශෛලියෙන් යුත් ආපන ශාලා ද ඉදි කර ඇත. එමෙන් ම, ඒ ඒ ක්ෂේත්‍ර පිළිබඳ පොත්පත්, ලිපිලේඛන මිලියන 6කට ආසන්න සංඛ්‍යාවක් සහිත නවීන පුස්තකාලයක් ද එහි ඇත. ඒ නිසා ජීවිතය සහ අධ්‍යාපනය පිළිබඳව ඔබට එහි පහසුවක් දැනෙයි.

ච ජ්‍යාං විශ්ව විද්‍යාලය පිළිබඳ වැඩිපුර තොරතුරු සඳහා පහත දැක්වෙන වෙබ් අඩවියට පිවිසෙන්න.

http://www.zju.edu.cn

ඉදිරිපත් කිරීම : හැන් ජ්යැන්











# 谈论情感 - හැඟීම් පිළිබඳ කථා කිරීමේදී

## 今日关键 අද පාඩමෙන් අවධානය

| | |
|---|---|
| 怎么了？ | ස්න්ම ල ?<br>මොකද වෙලා තියෙන්නේ ? |
| 你别再吸烟了。 | නී බියේ සයි ශී යිඇන් ල.<br>ඔයා ආයෙත් නම් දුම්වැටි බොන්න එපා. |
| 我很想家。 | වෝ හෙන් සියාං පියා.<br>පවුලේ අයගේ අඩුව මට හුඟක් දැනෙනවා. |

## 对话 一 පළමු සංවාදය

| | |
|---|---|
| 怎么了？ | ස්න්ම ල ?<br>මොකද වෙලා තියෙන්නෙ ? |
| 我肚子疼。 | වෝ දු ස් තන්ග්.<br>මගේ බඩ රිදෙනවා. |

## 对话 二 දෙවන සංවාදය

| | |
|---|---|
| 你别再吸烟了。 | නී බියේ සයි ශී යිඇන් ල.<br>ඔයා ආයෙත් නම් දුම්වැටි බොන්න එපා. |
| 我知道有害健康。 | වෝ ච ඩාඕ යුඕ හයි පියැන් කාං.<br>මම දන්නවා එයින් සෞඛ්‍යයට හානි වෙනවා කියලා. |

## 对话 三 තෙවන සංවාදය

| | |
|---|---|
| 你在学校还好吗？ | නී සයි ෂුවැයි ෂියාඕ හයි හඕ මා ?<br>ඔයා විශ්ව විද්‍යාලයේ හොඳින් ඉන්නවා ද ? |
| 我很想家。 | වෝ හෙන් සියාං පියා.<br>පවුලේ අයගේ අඩුව මට හුඟක් දැනෙනවා. |

### චීන සංස්කෘතියෙන් බිඳක්

පවුල් ඒකකය තුළ වඩාත් වැදගත් භූමිකාව හිමි වන්නේ කාට ද කියා විමසුවහොත් බටහිර සහ පෙරදිග සංස්කෘතීන් තුළ ප්‍රතිවිරුද්ධ පිළිතුරු ලැබෙන්නට පුළුවන්. සාම්ප්‍රදායික චීනයේ පවුලේ මූලිකත්වය හිමි වූයේ පවුලේ ජ්‍යේෂ්ඨතම සාමාජිකයාට හෝ සාමාජිකාවටයි. ඒ අනුව මුත්තණුවන් හෝ මිත්තණිය වෙසෙන පවුලක මීළඟ මූලිකත්වය හිමිවූයේ ඔවුන්ගේ වැඩිහිටි වියේ පසුවූ දරුවන්ට වූ අතර අනතුරුව අවධානය යොමු වූයේ එම දරුවන්ගේත් දරුවන්ටයි. චීන පවුලකට දරුවෙකු ඉපදුන විට පවුලේ සියල්ලන්ගේම ආදර සැලකිල්ලට ඒ දරුවා පත් වන්නේ නිරායාසයෙනි. එබැවින් මේ දරුවන් බොහෝ කුඩා වයසින්ම අධිරාජ්‍යයෙකුට හා සමාන සැලකිලි ලබයි. එදා වැඩිහිටියන්ට පවුල් ඒකකය තුළ තිබූ ඉහළ අවධානය අද වන විට දරුවන් වෙත යොමු වී තිබේ. මීට අමතරව ස්වාමි පුරුෂයා හා බිරිඳ අතර ඇති සබඳතාව ද වැදගත් බැවින් ගිලිහෙමින් පවතින බවටත් පවුල් ඒකක තුළින් ම අසන්නට ලැබෙයි.





# 谈论工作 - රැකියා පිළිබඳ කථා කිරීමේදී

## 今日关键 අද පාඩමෙන් අවධානය

| | |
|---|---|
| 你每天几点上班？ | නී මෙයි තියැන් පී දියැන් ෂාං බැන් ?<br>ඔයා හැමදාම කීයට ද වැඩ පටන් ගන්නෙ? |
| 你每天几点下班？ | නී මෙයි තියැන් පී දියැන් ෂ්‍යා බැන් ?<br>ඔයාට හැමදාම කීයට ද වැඩ ඉවර වෙන්නේ ? |
| 你以前做过什么工作？ | නී යි චියැන් සුඕ ගුඕ ෂෙන් ම ගොං සුඕ ?<br>ඔයා කළින් කරපු රැකියාව මොකක් ද? |
| 你在这里工作多长时间了？ | නී සයි ච ලි ගොං සුඕ දුවෝ චාං ෂී පියැන් ල ?<br>ඔයා කොච්චර කාලයක ඉඳලා ද මේ රැකියාව කරන්නේ ? |

## 对话 一 පළමු සංවාදය

| | |
|---|---|
| 你每天几点上班？ | නී මෙයි තියැන් පී දියැන් ෂාං බැන් ?<br>ඔයා හැමදාම කීයටද වැඩ පටන් ගන්නේ ? |
| 早上九点。 | සඕ ෂාං ජ්‍යු දියැන්.<br>උදේ නමයට. |
| 你每天几点下班？ | නී මෙයි තියැන් පී දියැන් ෂ්‍යා බැන් ?<br>ඔයාට හැමදාම කීයට ද වැඩ ඉවර වෙන්නේ ? |
| 晚上五点。 | වැන් ෂාං වූ දියැන්.<br>හවස පහට. |

## 对话 二 දෙවන සංවාදය

| | |
|---|---|
| 你以前做过什么工作？ | නී යි චියැන් සුඕ ගුඕ ෂෙන් ම ගොං සුඕ ?<br>ඔයා කළින් කරපු රැකියාව මොකක් ද? |
| 我以前是记者。你呢？ | වෝ යි චියැන් ෂි පි ච. නී න ?<br>මම කළින් වාර්තාකරුවෙක් වශයෙන් සිටියා. ඔයා? |
| 我以前是医生。 | වෝ යි චියැන් ෂි යි ෂෙන්ග්.<br>මම වෛද්‍යවරයෙක් වශයෙන් සිටියා. |

## 对话 三 තෙවන සංවාදය

| | |
|---|---|
| 你在这里工作多长时间了？ | නී සයි ච ලි ගොං සුඕ දුවෝ චාං ෂී පියැන් ල ?<br>ඔයා කොච්චර කාලයක ඉඳලා ද මේ රැකියාව කරන්නේ ? |
| 两年了。 | ලිආං නියැන් ල.<br>වසර දෙකක්. |

### චීන සංස්කෘතියෙන් බිඳක්

ඔබ උපයන වැටුපේ ප්‍රමාණය ඔබට පෞද්ගලික කාරණයක් වුවත් චීන මිනිස්සුන්ට නම් තවත් අයෙකුගේ වැටුප පිළිබඳ විමසීම ඔහු හෝ ඇය පිළිබඳ ඇති සැලකිල්ල ප්‍රකාශ කිරීමක් හා සමානයි. පැරණි චීන සමාජයේ වැටුප් පරතරයේ විශාල වෙනස්කම් නොතිබීමත් මෙසේ විමසීමට මූලික වන්නට ඇති. මිතුරන් හෝ කාර්යාල සගයන් මුණ ගැසුණ විටදී සිය වැටුප පිළිබඳ විවෘතව කථා කිරීමට චීන ජාතිකයන් පුරුදුවී සිටින්නේ සිය වැටුප් පරතරය හා වැටුප් වර්ධනය පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබාගැනීමටත් විය හැකියි. වර්තමානයේදී නම් තරුණ තරුණියන් සිය මූලික වැටුප, දීමනා, ප්‍රසාද දීමානා ඇතුළු සියලු තොරතුරු අන්තර්ජාලය මගින් හුවමාරු කර ගැනීමටත් පුරුදුව සිටින්නේ විවිධ රැකියා අතර ඇති වැටුප් පරතරය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමටයි.

# කෝලා සහිත කුකුල් පියාපත්



## අවශ්‍ය ද්‍රව්‍ය

- කුකුල් පියාපත් 6ත් 8ත් අතර සංඛ්‍යාවක් (chicken wings)
- කෝලාමිලි ලීටර් 200යි
- ඉඟුරු පෙති 8යි
- ලීක්ස් ගහකින් 3නෙන් 1ක කොටසක්
- සුදු ලූණුපෙති 6ක්
- තෙල් අවශ්‍ය ප්‍රමාණයට
- ලුණු අවශ්‍ය ප්‍රමාණයට
- පිසින වයින් ස්වල්පයක්
- සෝයා සෝස් ස්වල්පයක්

## සාදන ක්‍රමය

- කුකුල් පියාපත් උණු වතුරින් තම්බා එළියට ගන්න. රැගෙන උණු වතුරින් හොඳට සෝදා ගන්න.
- ඉඟුරු පෙති, ලීක්ස් හා සුදු ලූණු කුඩා කැබලි වලට කපන්න.
- ටූත්පික් වලින් කුකුල් පියාපත් මත හිල්විදින්න. පසුව මීට පෙර කුඩා කැබලිවලට සකසා ගත් ඉඟුරු ලීක්ස් සුදු ලූණු හා ලුණු, පිසින වයින්, සෝයා සෝස් එක්කර කුකුල් පියාපත් පදම් වීම සඳහා විනාඩි 20ක් පමණ තබන්න.
- තෙල් තාච්චියට දමා හොඳින් රත් කරන්න. ඉන්පසු පදම් වීමට තැබූ කුකුල් පියාපත් තාච්චියට දමා බැද ගන්න. බැද ගත් කුකුල් පියාපත් සහිත එම තෙල් භාජනයටම පියාපත් වැසෙන තුරු කෝලා එක්කර ගන්න.
- හොඳින් ඉතිරුපසු හොද්ද උකු වන තුරු මදගින්නේ තිබීමට හරින්න.

ඉදිරිපත් කිරීම : වං යිං



# තක්කාලිසහිත වම්බටු



## අවශ්‍ය ද්‍රව්‍ය

- වම්බටු ගෙඩි 6ක්
- තක්කාලි ගෙඩි 3ක්
- ග්‍රීන් පෙපර් ගෙඩියක්
- ඉඟුරු ස්වල්පයක්
- ලීක්ස් කඳින් භාගයක ප්‍රමාණයක්
- සුදු ලූණුපෙති 5ක්
- තෙල් අවශ්‍ය ප්‍රමාණයට
- ලුණු අවශ්‍ය ප්‍රමාණයට
- සීනි ස්වල්පයක්
- පිසිනවයින් ස්වල්පයක්
- සෝයා සෝස් අවශ්‍යපමණ
- වතුර දමා මිශ්‍ර කලකෝන් ෆ්ලවර් ස්වල්පයක්
- තල තෙල් ස්වල්පයක්

## සාදන ක්‍රමය

- වම්බටුවල පොතු ඉවත්කර සෝදා කැබලිවලට කපා ගන්න, එලෙස ම ග්‍රීන් පෙපර් හා තක්කාලිද කැබලිවලට කපා ගන්න.
- ඉඟුරු, ලික්ස් සහ සුදු ලූණු ඉතා කුඩා කැබලිවලට කපන්න.
- කපා ගත් වම්බටු කැබලි ගැඹුරු තෙලේ බැද එයට ම සකස් කළ ඉඟුරු, ලීක්ස්, සුදු ලූණු කැබලි එකතු කර ගන්න. පසුව එයට තක්කාලි කැබලිද එකතු කර පිසින වයින් යොදන්න. පසුව සෝයා සොස්, සීනි හා ලුණු දමා පිස ගන්න.
- ඉන් පසු ඇල් වතුර ස්වල්පයක් ද එකතු කරන්න.
- එහි ඇති හොදි ප්‍රමාණය අඩුවන විට ග්‍රීන් පෙපර් පෙතිද දමන්න.
- වතුර හා මිශ්‍ර කරන ලද කෝන් ෆ්ලවර් දමා එයට ම තල තෙල් ස්වල්පයකුත් එකතු කර ස්වල්ප වේලාවක් තබා ලිප නිවන්න.



# මීපැණි

## රූපලාවණ්‍ය ක්‍රම කිහිපයක්



ඉදිරිපත් කිරීම : ෂී යුයෑ



අපි කවුරුත් ලස්සණට ඉන්න කැමතියි. විශේෂයෙන්ම කාන්තාවන් තම රූ සපුව ගැන ඉහළ උනන්දුවක් දක්වනවා. ඒ නිසා ඔබට ලස්සණ වෙන්න පුළුවන් පහසු ක්‍රම වශයෙන් මී පැණි භාවිත කරන රූපලාවණ්‍ය ක්‍රම කිහිපයක් ඔබට හඳුන්වා දීමට අපි කැමතියි.

මී පැණි ඇඟට ගුණ ආහාර වර්ගයක් වගේ ම එය හොඳ රූපලාවණ්‍ය ද්‍රව්‍යයක් කියලා ඔබ දැනටමත් දන්වා ඇති. අඛණ්ඩව මී පැණි ආහාරයට ගැනීම හෝ මුහුණේ ආලේප කිරීමෙන් ඔබේ සම කුඩා දරුවෙකුගේ මෙන් සුසිනිඳු, සෞම්‍ය ලෙස පැහැපත් වෙනවා. මී පැණි හා ඒ ප්‍රමාණයට ගුණ දෙකක හෝ තුනක වතුර එකට එකතු කර දිනපතා ම මුහුණේ ආලේප කරන්න. ඉන් ඔබේ සම සෞම්‍ය බවට පත් වෙනවා. තවත් ක්‍රමයක් තියෙනවා, මී පැණ ග්‍රෑම් 50ක් සහ බිත්තරක සුදු මදයේ කොටසක් එකට එකතු කරමින් නිදා ගන්නට පෙර මුහුණේ ආලේප කරමින් සෙමින් සම්භාහනය කරන්න. විනාඩි තිහකින් පසු සෝදා පිරිසිදු කරන්න. සතියකට දෙවරක් ඒ විදිහට කලා ම ඔබේ සමේ රැලි අඩු වෙන්න පුළුවන්, සම ලිහිල් වෙන්නේ නැහැ.

මී පැණි ආහාරයට ගැනීමත් ඇඟට ගුණයි. උදෑසන අවදිවීමෙන් පසු මී පැණි සහිත වතුර පානය කිරීමෙන් කුස තුළ ඇති අහිත කර බහිශ්‍රාවීය ද්‍රව්‍ය පහසුවෙන් ඉවත් කිරීමට හේතු වෙනවා. චීන ජාතිකයන්ට නම් මී පැණි ඖෂධ වර්ගයක් නෙමෙයි. එය ආහාර වර්ගයක්. මිළෙන් ටිකක් වැඩි නමුත් දැන් චීනයේ මී පැණි නිෂ්පාදන ශාලා විශාල සංඛ්‍යාවක් තිබෙනවා. ඉන් ලැබෙන මී පැණි ප්‍රමාණය සාමාන්‍ය ජනතාවගේ දෛනික ජීවිත අවශ්‍යතාවට ප්‍රමාණවත්.



## පස්වන පාඩම

# ස්වසනය හෝ හෘදය ඇණහිටි රෝගියෙකුට ප්‍රථමාධාර කරමු

අනතුරු හෝ රෝග තත්ත්වයක් නිසා ඇතිවන හදිසි අවස්ථාවකදී නිශ්චලව වැටී සිටින පුද්ගලයෙකු ස්වසනය නොකරයි නම් එය එම පුද්ගලයාගේ ජීවිතය සම්බන්ධයෙන් ඇති ප්‍රබලම අවදානමයි. එවන් අවස්ථාවකදී ඉතා සුළු වේලාවක් තුළ වෛද්‍ය ප්‍රතිකාර නොලැබුණහොත් රෝගියා නිසැකවම මිය යනු ඇත.

ස්වසනය ඇණහිටි විට හෘදය ද විනාඩි 5 පමණ කාලයක් තුළ ඇණහිටී. හෘදය ඇණහිටීමෙන් රුධිර ගමනාගමනය නතර වන අතර සිරුරේ අතිශය වැදගත් ඉන්ද්‍රියයක් වන මොළය වෙත ඔක්ෂිජන් නොලැබී ගියහොත් විනාඩි 04 ක පමණ කාලයක් තුළ මොළයේ සෛල මැරී යයි. එවැන්නක් සිදු වූ විට මොළය මගින් ක්‍රියාත්මක වන සියලු ක්‍රියා නතර වී ජීවිතය යළි බේරා ගැනීමට ඇති අවකාශය සම්පූර්ණයෙන් නතර වේ. ස්වසනය ඇණහිටි අයෙකු රෝහල්ගත කිරීමට ගතවන කාලය තුළ ඉහත කී සංසිද්ධීන් සිදුව මරණය තීන්දු වීමට වුව අවකාශ තිබේ. එම නිසා මෙවන් අවස්ථාවකදී රෝගියා රෝහල්ගත කරන තෙක් රුධිර ගමනාගමනය හා ස්වසනය කෘතීමව හෙවත් බාහිරව සක්‍රීයව පවත්වාගෙන යාමට හැකි ක්‍රමවේදයක් ප්‍රථමාධාර විද්‍යාවේ දක්නට ලැබේ. එය කන්තුක පුප්ඵුශීය පුනරුත්ථානය (Cardio Pulmonary Resuscitation – CPR) ලෙස හඳුන්වයි. මූලික ජීවිතාරක්ෂක ක්‍රියාවලිය (Basic Life Support) ලෙස ද මෙය හැඳින්විය හැකිය.

CPR හිදී හෘදය සක්‍රීය කිරීම සඳහා කෘතිම පපු පීඩනය ලබා දී හෘදය සක්‍රීය කරවන අතර කෘතිම ස්වසනය ලබා දී ඔක්ෂිජන් පෙනහළුගත කරවනු ලබයි. එම ක්‍රියාවලිය සිදු කරන අයුරු දැන් අප පියවර වශයෙන් විමසා බලමු.

## ස්වසනය නොකරන වැඩිහිටි රෝගියෙකුට සිදු කරන මූලික ජීවිතාරක්ෂක ක්‍රියාවලිය (CPR ලබා දීම)

මෙය සිදුකිරීමේදී රෝගියා පැතළි පොළව හෝ ඝන පෘෂ්ඨයක් මත තැබිය යුතුය.

**01. Call for an Ambulance ගිලන් රථයකට අමතන්න**

ඔබ විසින් හෝ අවට සිටින අයෙකු ලවා ඉක්මනින් ගිලන් රථයක් හෝ සුදුසු වාහනයක් අමතා සූදානම් කරවන්න.



**02. Chest Compression පපු පීඩනය**

පපු පීඩන වාර 30 ක් ලබා දෙන්න. ඒ සඳහා රූපයේ පරිදි රෝගියා අසල වාඩි වී ඔබ හුරු අතෙහි අත්ලෙහි පහළ කොටස පපුවේ හරි මැද තබන්න. අනෙක් අත ඒ මත තබා ඇඟිලි අතරින් ඇඟිලි යොමු කොට තබා ගන්නා. ගැඹුර අඟල් 1 1/2 - 02 ක් අතර හා වේගය





විනාඩියකට 100 ක් වන පරිදි සෑජුව තබාගත් දෑත් මගින් පපු පීඩන වාර 30 ක් ලබා දෙන්න.

**03. Rescue Breaths කෘතිම ස්වසනය**

කෘතිම ස්වසන වාර 02 ක් ලබා දෙන්න. මේ සඳහා රෝගියාගේ ස්වසන මාර්ගය විවෘතව තබා නාස් පුඩු මිරිකන්න. සාමාන්‍ය ස්වසන වාරයක් ගන්න.



මුඛයට මුඛය මුද්‍රා වන සේ ඔබගේ මුඛය තබන්න. පපු ප්‍රදේශය එසවෙන තෙක් ස්වසන වාරයක් ලබා දෙන්න. තප්පරයක කාලයක් නාසය හා මුඛය මුදාහැර නැවත පෙර පරිදි ස්වසන වාරයක් දෙන්න. එක් වාරයකට තප්පර 01 ක් ගත කරන්න.

**04. Continue 30:02 - CPR පවත්වාගෙන යාම**

30:02 අනුපාතය යටතේ පපු පීඩනය හා කෘතිම ස්වසන වාර රෝගියා රෝහල්ගත කරනතෙක් ලබා දෙන්න. සෑම විනාඩි 02 කට වරක් CPR ලබා දෙන්නා මාරු කළ හැකි නම් උචිතය. රෝගියා ස්වසනය ආරම්භ කළ හොත් CPR නවතා ස්වසනය සහ රුධිර සංසරණය පරීක්ෂා කරමින් රෝහල්ගත කරන්න.



30



02

## ස්වසනය නොකරන ළමයෙකුට සිදු කරන මූලික ජීවිතාරක්ෂක ක්‍රියාවලිය (CPR ලබා දීම)

අසිහි ළමයෙකු පරීක්ෂා කිරීමේදී රෝගියා ස්වසනය නොකරයි නම් පහත පියවරයන් අනුගමනය කරන්න.

**01. Call for an Ambulance - ගිලන් රථයකට අමතන්න**

**02. Rescue Breaths - කෘතිම ස්වසනය**

වැඩිහිටියෙකුට ලබා දෙන පරිදි කෘතිම ස්වසන වාර 05 ක් ලබා දෙන්න.

**03. Chest Compression - පපු පීඩනය**

පපු පීඩන වාර 30 ක් ලබා දෙන්න. ගැඹුර පපු උසෙන් 1/3 ක් හා වේගය විනාඩියකට 100 ක් වන පරිදි සෑජුව තබාගත් එක් අතක් මගින් පපු පීඩන වාර 30 ක් ලබා දෙන්න.

**04. Rescue Breaths - කෘතිම ස්වසනය**

පෙර පරිදි ස්වසන වාර 02 ක් ලබා දෙන්න.

**05. Continue 30:02 - CPR පවත්වාගෙන යාම**

30:02 අනුපාතය යටතේ (ස්වසන වාර 05 කින් ආරම්භ කිරීමෙන් අනතුරුව) පපු පීඩනය හා කෘතිම ස්වසන වාර රෝගියා රෝහල්ගත කරනතෙක් ලබා දෙන්න.



## ස්වසනය නොකරන ළදරුවෙකුට සිදු කරන මූලික ජීවිතාරක්ෂක ක්‍රියාවලිය (CPR ලබා දීම)

අසිහි ළදරුවෙකු පරීක්ෂා කිරීමේදී ළදරුවා ස්වසනය නොකරයි නම් පහත පියවරයන් අනුගමනය කරන්න.

**01. Call for an Ambulance - ගිලන් රථයකට අමතන්න**

**02. Rescue Breaths - කෘතිම ස්වසනය**

ළදරුවාගේ නාසය හා මුඛය වැසෙන සේ ඔබගේ මුඛය තබා කෘතිම ස්වසන වාර 05 ක් ලබා දෙන්න. එක් වාරයකට තප්පර භාගයක් ගත කරන්න.

## 03. Chest Compression - පපු පීඩනය



පපු පීඩන වාර 30 ක් ලබා දෙන්න. ගැඹුර පපු උසෙන් 1/3 ක් හා වේගය විනාඩියකට 100 ක් වන පරිදි සෘජුව තබාගත් ඇඟිලි 02 ක් මගින් පපු පීඩන වාර 30 ක් ලබා දෙන්න.

## 04. Rescue Breaths - කෘතිම ස්වසනය

පෙර පරිදි ස්වසන වාර 02 ක් ලබා දෙන්න.



## 05. Continue 30:02 - CPR පවත්වාගෙන යාම

ස්වසන වාර 05 කින් ආරම්භ කිරීමෙන් අනතුරුව පපු පීඩනය හා කෘතිම ස්වසන වාර 30:02 අනුපාතය යටතේ රෝගියා රෝහල්ගත කරනතෙක් ලබා දෙන්න.

ඉහත ප්‍රථමාධාර ක්‍රමශිල්ප එදිනෙදා ප්‍රායෝගිකව භාවිතා කිරීම සඳහා විධිමත් ප්‍රථමාධාර පුහුණුවකට සහභාගී වීම අත්‍යවශ්‍ය වන අතර මෙම තොරතුරු කියවීම පමණක් CPR ලබා දීමට තරම් කිසිසේත්ම ප්‍රමාණවත් හැකියාවක්, දැනුමක් හා විශ්වාසයක් ලබා නොදෙයි. ජීවිතයට අතිශය වැදගත් මෙවැනි ප්‍රථමාධාර ක්‍රම ශිල්ප පිළිබඳ විධිමත් පුහුණුවක් ලබා ගැනීමේ අවස්ථාව ශ්‍රී ලංකා රතු කුරුස සමාජය මගින් ඔබට ලබා ගත හැක. ඒ පිළිබඳ තොරතුරු සඳහා www.redcross.lk වෙත පිවිසෙන්න. කතා කරන්න 0115347000.







**සුභාසර පාඨක සාමාජිකත්වය**

චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය සහ ශ්‍රී ලංකා රතු කුරුස සමාජය ඒකාබද්ධව ත්‍රෛයි මාසිකව නිකුත් කරනු ලබන සුභාසර සඟරාවේ පාඨක සාමාජිකත්වය ලබා ගැනීම සඳහා පහත විස්තර පුරවා මෑතකදී ගත් 2.5 x 3.5 cm ප්‍රමානයේ ඡායාරූපයක් සමග අපගේ ලිපිනය වෙත යොමු කරන්න.

නම : ..............................................................................................

ලිපිනය : ..............................................................................................

වයස : ...................................... පාසල : ..............................................

දුරකථන : ...................................... විද්‍යුත් ලිපිනය : ......................................

ප්‍රශ්නය : මෙවර සුභාසර කලාපයේ ඔබ වඩාත් කැමති ලිපිය කුමක්ද?

පිළිතුර : ..............................................................................................

අපගේ ලිපිනය : 4/91A, 5 වන පටුමග, තලකොටුව වත්ත, පොල්හේන්ගොඩ, කොළඹ 05. P. O Box : 1774




| | Frequency | Time (Sri Lanka) | |
|---|---|---|---|
| FM | CRI - Sri Lanka FM97.9 | 05.00-10.00 (Eng) | 10.00-00.00 (Sin) |
| Short wave | 49.8/31.6/30.61/25.21 | 19:30-20:30 | 05:00-06:00 |
| Online | http://sinhalese.cri.cn/ | | |

# චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය

ශ්‍රී ලංකා ජන ජීවිතය මැනවින් හඳුනාගත් සුහද මිතුරෙකු ලෙස චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය ඉදිරි ගමනක් ආරම්භ කර තිබේ. ශ්‍රී ලංකාව පුරා විසුරුවා හැරෙන කෙටි තරංග සහ බස්නාහිර පළාත ආවරණය කරන FM තරංග විකාශනයක් සිංහල සේවය සතුවෙයි. සියළු වැඩසටහන්වලට පොඩ්කාස්ටින් සේවාව ඔස්සේද සවන් දිය හැකිය.

සිංහල සේවය ආරම්භ වුයේ වසර 1975 ජනවාරි පළමු දාය. එවක පැවැතියේ කෙටි තරංග විකාශනයක් පමණි. වසර 2010 අප්‍රේල් 23 වනදා එහි FM තරංග විකාශනය ආරම්භ කෙරිණ.

මේ වන විට චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි හා රූපවාහිනී මාධ්‍ය හා පුවත්පත් සමඟ මනා සහයෝගික සම්බන්ධතාවකින් යුක්තව ඉදිරියට ගමන් කරමින් සිටී.

චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවයේ වැඩසටහන් ශ්‍රී ලංකාවේ සමස්ත පවුල් ඒකකය ඉලක්ක කොට විසුරුවා හරිනු ලැබේ. වැඩසටහන් අන්තර්ගතය චීනය සහ ශ්‍රී ලංකාව අතර ඇති සාම්ප්‍රදායික මිත්‍රත්වය සහ රාජ්‍යතාන්ත්‍රික බැදීම පදනම් කොට සකස් කර තිබේ. සතියේ දින පහ තුළ, ආර්ථිකය, සංස්කෘතිය, ජන ජීවිතය සහ මිත්‍රත්වය, සංචාරය, සූප කලාව, චීනයේ භාෂා අධ්‍යයනය වැනි විෂය ක්ෂේත්‍ර ඔස්සේ වැඩසටහන් විකාශනය කෙරේ. විචිත්‍රාංග සමාජ හා කාලීන තොරතුරු සඳහා ද විශේෂත්වයක් හිමිව තිබේ. චීනයේ ශ්‍රී ලංකාවේ සහ ලෝකයේ නැවුම් තොරතුරු රැගත් ප්‍රවෘත්ති විකාශනයක්ද දිනපතා සිදුකෙරේ.

中 国 国 际 广 播 电 台
CHINA RADIO INTERNATIONAL


**SINHALA SERVICE**
**CHINA RADIO INTERNATIONAL**

No.16A, Shijingshan Road,
Beijing, P.R. China
Post code:100040
Tel: 00 86 10 6889 2330/2374
Fax: 00 86 10 68892361
Email: sinhalacri@gmail.com
Web: http://sinhalese.cri.cn/
Facebook: Cheena Sinhala handa
Twitter: Voice of China-Lanka